# ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය

අංක 158 — 1975 අප්‍රේල් 04 වැනි සිකුරාද — 1975.04.04

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී.)

## I වැනි කොටස: (IIඅ) වැනි ඡේදය—පළකිරීම්

(වෙන වෙනම ගොනුකර ගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)

| | පිට | | පිට |
|---|---|---|---|
| තනතුරු—ඇබෑර්තු ... ... ... ... | 391 | විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | 404 |

## තනතුරු—ඇබෑර්තු

**ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයෙහි පළකරනු ලබන රාජ්‍ය සේවා පත්කිරීම්වලට අදාළ වන පොදු කොන්දේසි**

**1. අවශ්‍ය සාමාන්‍ය සුදුසුකම් :**

1 : 1 තමා ලාංකිකයෙකු බවට ප්‍රමාණවත් සාක්ෂි සෑම අයදුම්කරුවකු විසින්ම ඉදිරිපත් කළ යුතුය.

"ලාංකික" යනුවෙන් අදහස් කෙරෙනුයේ ලංකා පුරවැසි පනතේ අර්ථ දක්වා ඇති පරිදි පාරම්පරික වශයෙන් හෝ ලියාපදිංචි කරවා ගැනීමෙන් හෝ ශ්‍රී ලංකාවේ පුරවැසිකම ලැබූවෙකි.

1.: 2 ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන හෝ ඊට වඩා උසස් විභාගයකින් සමත් වී තිබීම අවම අධ්‍යාපනික සුදුසුකමක් වශයෙන් නියම කොට ඇති යම් තනතුරක් සඳහා ඉල්ලුම් කරන අයදුම් කරුවකු සිංහල මාධ්‍යයෙන් අධ්‍යාපනය ලැබූ සිංහලයෙක් වේ නම්, ඔහු ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන විභාගයකින් හෝ සිංහල භාෂාව විෂයයෙන් සමත් වී සිටිය යුතුය. (1961 ජනවාරි මස 1 වැනි දිනට පෙර දිනෙක සිට රාජ්‍ය සේවයෙහි යෙදී සිටින්නාවූත් රාජ්‍ය සේවයෙහි වෙනත් තනතුරුවලට ඉල්ලුම්කරන්නාවූත් නිලධාරීන් විෂයෙහි මෙම නියමය අදාළ නොවන්නේය.)

1 : 3 නියමිත සිංහල ප්‍රවීනතා පරීක්ෂණයෙන් අසමත්වීම හේතු කොට ගෙන පරිවාස/පරීක්ෂණ කාලය සහිත සේවය අවසන් කරනු ලැබූ "නව ප්‍රවේශයක" රජයේ නිලධාරීන් ව සිටි අය, අංක 640 දරණ භාණ්ඩාගාර චක්‍රලේඛය අනුව අදාල තනතුරට හෝ සේවයට නියමිත වූ ඉහළම සිංහල ප්‍රවීණතා පරීක්ෂණයෙන් නිදහස් වීමට හිමිකම් ලබන අන් දමේ සුදුසුකම් ලබා ගෙන සිටිනොත් මිස, එසේ නොමැති නම්, ඔවුන්ගෙන් ලැබෙන අයදුම්පත් භාරගනු නොලැබේ.

2. දීමනා :

2 : 1 ඒ ඒ තනතුරට අදාළ මාසික ඒකාබද්ධ වැටුපට අතිරේක වශයෙන්, රාජ්‍ය සේවයෙහි නියුක්ත මාසික වැටුප් ලබන සියලුම විවාහක නිලධාරීන්ට ආයතන සංග්‍රහයේ 8 වැනි පරිච්ඡේදයෙහි 1 වැනි වගන්තියෙහි දක්වා ඇති පදනම මත විවාහක දීමනාවක් ගෙවනු ඇත.

---

**සතිපතා නිකුත්වන ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා එවනු ලබන දැන්වීම් පිළිබඳ**

**විශේෂ නිවේදනයයි**

ශ්‍රී ලංකා ජනරජයේ සතිපතා පළවන ගැසට් පත්‍රයේ I වැනි කොටසේ (II අ) සහ (II ආ) වැනි ඡේදයෙහි පළවිය යුතු දැන්වීම් ගැසට් පත්‍රය පළවන සතියට පෙර සතියේ බදාදා දවල් 12.00 ට පෙර රජයේ මුද්‍රණාලයට ලැබිය යුතුයි. ප්‍රමාදවී ලැබෙන දැන්වීම් කුමන හේතුවක් නිසාවත් භාරගනු නොලැබේ.

1972 දෙසැම්බර් මස 15 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ.

එල්. ඩබ්ලිව්. පී. පීරිස්,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

---

2 : 2 (සියලුම දීමනාවන් ද ඇතුලුව) රු. 180 සිට රු. 250 දක්වා මාසික වැටුප්/වේතන ලබන ගණයට අයත් රාජ්‍ය නිලධාරීන්ට මාසික වශයෙන් රු. 7.50 ක විශේෂ දීමනාවක් ගෙවනු ඇත. අවශ්‍ය තැන මෙම දීමනාව ක්‍රමික කිරීමට ඉඩ ඇත.

**3. සේවා කොන්දේසි—සාමාන්‍ය :**

3 : 1 රාජ්‍ය සේවයෙහි යෙදී සිටින සියලුම නිලධාරීහු මුදල් රෙගුලාසි, ආයතන සංග්‍රහය, දෙපාර්තමේන්තු නියෝග හෝ රෙගුලාසි සහ රජය විසින් වරින් වර නිකුත් කරනු ලැබිය හැකි වෙනත් නියෝග හෝ රෙගුලාසිවලට යටත් විය යුත්තාහ.

3 : 2 අදාළ අමාත්‍යාංශයෙහි ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි ප්‍රමාණයේ මුදලක් එම ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි අන්දමකින් ඇප තබන ලෙස රාජ්‍ය සේවා නිලධාරීන්ගේ (ඇප) ආඥාපනත යටතේ රාජ්‍ය නිලධාරියෙකුට නියම කරනු ලැබිය හැකිය.

3 : 3 දිවයිනෙහි ඕනෑම තැනක සේවය කිරීමට රාජ්‍ය නිලධාරියෙකුට නියම කරනු ලැබිය හැකිය.

**4. ස්ථිර පත්වීම් දරණ රාජ්‍ය නිලධාරීන්ට අදාළ සේවා කොන්දේසි :**

4 : 1 ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරීහු පූර්වෝක්ත 3 වැනි වගන්තියෙහි සඳහන් කොන්දේසිවලට අතිරේක වශයෙන් පහත දැක්වෙන අතිකුත් කොන්දේසිවලටද යටත් විය යුත්තාහ :—

4 : 1 : 1 යම්කිසි තනතුරක පරිවාස කාලය අවුරුදු තුනකට වැඩි විය යුතුයැයි සලකනු ලබන්නේ නම් විනා, එසේ නොමැති නම්, සියළුම පත්කිරීම් අවුරුදු 3 ක පරිවාස කාලයකට යටත් වනු ඇත. පරිවාස කාලය තුළ, හේතුවක් නොදක්වා සේවය කෙළවර කරනු ලැබිය හැකිය.

4 : 1 : 2 රාජ්‍ය සේවයෙහි "නව ප්‍රවේශකයන්" වන සියලුම රාජ්‍ය නිලධාරීහු, රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියෙහි අවශ්‍යතාවන් සඳහා 1956 අංක 33 දරණ රාජ්‍ය භාෂා පනතෙහි විධිවිධානවලටත්, රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා දැනට ක්‍රියාත්මකව පවත්නාවූත්, අනාගතයේදී පනවනු ලැබිය හැකිවූත් නීති සහ ව්‍යවස්ථා වෙතොත්, ඒවාටත් අනුකූල විය යුත්තාහ.

4 : 1 : 3 රාජ්‍ය භාෂාවෙන් වැඩ කිරීමට හැකි වන අන්දමේ දැනුමක් තමන්ගේ පරිවාස කාලය ඇතුළත ලබා ගන්නා ලෙස සියලුම රාජ්‍ය නිලධාරීන්ට නියම කෙරේ.

4 : 1 : 4 පරිවාස කාලය අවසානයේදී තනතුරෙහි ස්ථිර කරනු ලැබීමට අදාල වන වෙනත් කරුණු අතර, අවුරුද්දක් ඇතුළත සිංහල ප්‍රවීණතා පරීක්ෂණයෙහි I වැනි ශ්‍රේණියෙන් සමත් වීමත්, අවුරුදු දෙකක් ඇතුළත සිංහල ප්‍රවීණතා පරීක්ෂණයෙහි II වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් (අවශ්‍ය නම්), අවුරුදු තුනක් ඇතුළත සිංහල ප්‍රවීණතා පරීක්ෂණයෙහි III වැනි ශ්‍රේණියෙන් සමත් වීමත් බලපවත්වනු ඇත.

නියමිත කාලසීමාව ඇතුළත දී පරීක්ෂණයකින් අසමත් වුවහොත් වැටුප් වර්ධකයන් තාවකාලිකව අත්හිටවනු ලැබිය හැකිය. නියමිත කාල සීමාව ඉක්මී නව මාස හයක කාල සීමාවක් ඇතුළත යථෝක්ත පරීක්ෂණයෙන් සමත් වීමට අසමත් වුවහොත්, එසේ වැටුප් වර්ධක තාවකාලිකව අත්හිටුවීම, වැටුප් වර්ධක නතර කිරීමකට පරිවර්තනය කෙරෙනු ඇත. පරීක්ෂණයෙන් සමත් වන තෙක් හෝ පහත දැක්වෙන 4 : 1 : 5 වැනි වගන්තියෙහි විධිවිධානයන් බලපවත්වන තෙක් හෝ යථෝක්ත වැටුප් වර්ධකයන් නතර කිරීම ක්‍රියාත්මක වන්නේය.

4 : 1 : 5 පරිවාස කාල සීමාව අවසානයේදී සිංහල ප්‍රවීණතාවය පිළිබඳ නියමිත තත්ත්වයට පැමිණීමට නොහැකි වුවහොත්, එකිලා ආයතන සංග්‍රහයේ II වැනි පරිච්ඡේදයෙහි 12 : 13 වැනි වගන්තියෙහි විධිවිධානයන් ක්‍රියාත්මක වනු ඇත.

4 : 1 : 6 සිංහල මාධ්‍යයෙන් සේවයට බඳවා ගනු ලබන අය විෂයෙහි 4 : 1 : 3, 4 : 1 : 4 සහ 4 : 1 : 5 වැනි වගන්ති අදාළ නොවන්නේ ය.

4 : 1 : 7 රාජ්‍ය සේවයෙහි ස්ථිර තනතුරක දැනටමත් ස්ථිර කරනු ලැබ සිටින රාජ්‍ය නිලධාරියෙකු රාජ්‍ය සේවයෙහි වෙනත් ස්ථිර තනතුරකට පත්කරනු ලැබූ විට යළි පරිවාස කාලසීමාවක් සේවය කරන ලෙස සාමාන්‍යයෙන් ඔහුට නියම කරනු නොලැබේ. එවැනි නිලධාරියකු සිය නව තනතුරෙහි කර්තව්‍ය සේවය පරීක්ෂා කර බැලීම සඳහා ප්‍රථමයෙන් එම තනතුරෙහි නියමිත කාල සීමාවක් වැඩ බැලීම සඳහා ඔහු පත් කරනු ලැබිය හැක.

4 : 1 : 8 (රාජ්‍ය සේවයෙහි දැනටමත් ස්ථිර/තාවකාලික තනතුරු දරන්නාවූද, වෛද්‍ය පරීක්ෂණයට භාජන කරනු ලැබුවාවූද, අය හැර) තෝරා ගනු ලැබූ අපේක්ෂකයන් දිවයිනෙහි ඕනෑම පෙදෙසක සේවය කිරීමට ශාරීරිකව සුදුසුද නැද්ද යනු පරීක්ෂා කිරීම පිණිස රජයේ වෛද්‍ය නිලධාරියකු විසින් පවත්වනු ලබන වෛද්‍ය පරීක්ෂණයකට ඉදිරිපත් වන ලෙස ඔවුන්ට නියම කෙරෙනු ඇත.

**5. සේවයට භාරගැනීම පිළිබඳ කොන්දේසි :**

5 : 1 1972.01.01 වැනි දිනට පසු ස්ථිර සේවයට අයත් තනතුරුවලට හෝ තාවකාලික සේවයට අයත් මාසික වැටුප් සහිත තනතුරුවලට හෝ (දෛනික වැටුප් රේට් ප්‍රමාණයන් ගෙවනු ලබන—සේවකයන් හැරයි) පත් කරනු ලබන සියලුම රාජ්‍ය නිලධාරීන් විසින් තමන්ගේ ඒකාබද්ධ වැටුපෙන් සියයට 6ක් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට දායක මුදල් වශයෙන් ගෙවිය යුතු වන්නේය. මුදල් වර්ෂය අවසානයේදී ගෙවා ඇති ඒකාබද්ධ වැටුපෙන් සියයට 9ක් රජය විසින් එම අරමුදලට දායක මුදල් වශයෙන් ගෙවනු ඇත. එබඳු තනතුරක් දරන්නකුට (කැමති නම්) තමාගේ මනාපය පරිදි තම මාසික ඒකාබද්ධ වැටුපෙන් තව සියයට 6ක් දක්වා වූ ස්වේච්ඡා දායක මුදලක් එම අරමුදලට ගෙවිය හැක. එහෙත් එම දායක මුදල වෙනුවෙන් රජය විසින් දායක මුදලක් නොගෙවනු ඇත.

5 : 2 1971.12.31 වැනි දිනට පෙර රාජ්‍ය සේවයෙහි ස්ථිර සහ විශ්‍රාම වැටුප් හිමි තනතුරු දරමින් සිටි රාජ්‍ය නිලධාරීන්, 1972.01.01 වැනි දිනට පසු, රාජ්‍ය සේවයෙහි ස්ථිර තනතුරකට පත් කරනු ලැබුවහොත්, එම තනතුර දරන නිලධාරියාට පමණක් පෞද්ගලික වූවක් වශයෙන් යථෝක්ත විශ්‍රාම වැටුප් හිමිකම් නොකඩවා භුක්ති විඳීමට ඉඩදෙනු ඇත. එම රාජ්‍ය නිලධාරියා පෙර පරිදිම වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් ගෙවිය යුතු වනු ඇත.

5 : 3 1971. 12. 31 දින රාජ්‍ය සේවයෙහි විශ්‍රාම වැටුප් සහිත තනතුරු උසුලන ලද 1972. 01. 01 දිනට පසුව පළාත් පාලන සේවයෙහි විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදා හරිනු ලැබූ නිලධාරීන් සහ 1971. 12. 31 දින පළාත් පාලන සේවයෙහි විශ්‍රාම වැටුප් සහිත තනතුරු උසුලන ලද 1972. 01. 01 දිනට පසුව රාජ්‍ය සේවයෙහි විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදා හරිනු ලැබූ නිලධාරීන්හට පිළිවෙලින් ඔවුන්ගේ පළාත් පාලන සේවයෙහි සහ රාජ්‍ය සේවයෙහි තනතුරු සඳහා ඔවුන් හට පෞද්ගලික වන සේ විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ.

5 : 4 විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය යටතේ රාජ්‍ය සේවයෙහි විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට 1972.01.01 දිනට පසුව මුදා හරිනු ලැබූ සහ 1971.12.31 දින විශ්‍රාම වැටුප් සහිත වූ හමුදා, නාවික, සහ ගුවන් හමුදාවේ නිත්‍ය සේවයෙහි නියුතු පිරිසට ඔවුන්ගේ රාජ්‍ය සේවයෙහි තනතුරු සඳහා විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ. කෙසේ වුවද, විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය යටතේ ඔවුන්ගේ හමුදා, නාවික හා ගුවන් හමුදා සේවය ඔවුන්ගේ විශ්‍රාම වැටුප් සහිත රාජ්‍ය සේවය සමග විශ්‍රාම වැටුප් සඳහා ගණන් ගනු නොලැබේ.

**6. යුද්ධ සේවා අනුග්‍රහය :**

6 : 1 එක්සත් රාජ්‍යයේ යුද්ධාවතීර්ණ හමුදාවන්හි ශස්වා මුක්ත භටයින්ද සහාය ගිනි නිවන, ගගන ප්‍රහාර නිවාරණ සහ මහජනාරක්ෂක සේවාවන්හි පූර්ණ කාලීන සාමාජිකයන් වශයෙන් නියුක්තව සිට තමන්ගේම ඕනෑකමින් එම සේවාවන්ගෙන් අස් වී නොගිය අයට ද

ඉහත කී සියළුම සුදුසුකම් තිබේ නම් ද, ඔවුන් මෙම හමුදා වන්ට බැඳී ඇත්තේ 1945 අගෝස්තු මස 15 වැනි දිනට පෙරාතුව නම්ද, ඔවුන්ගේ එම සේවය සතුටුදායක ලෙස සහ අඛණ්ඩව පැවතිණි නම් ද, වයස අතින් සුදුසුකම් ලබා ගැනීම සඳහා ඔවුන්ට තමන්ගේ වයස්වලින් 1939 සැප්තැම්බර් මස 3 වැනි දින සිට 1949 දෙසැම්බර් මස 31 වැනිදා දක්වා වූ කාල සීමාව තුළ තම තමන් සේවය කළ කාලයන් අඩුකර ගැනීමට ඉඩ දෙනු ලැබේ.

**7. රාජ්‍ය සේවයෙහි දැනට සේවය කරන නිලධාරීහු :**

7 : 1 රාජ්‍ය සේවයෙහි දැනට සේවයෙහි යෙදී සිටින්නාවූත්, අවශ්‍ය සියළුම සුදුසුකම් ඇත්තාවූත්, නිලධාරීන් විසින් ඉදිරිපත් කරන අයදුම්පත් ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානයන්ගේ මාර්ගයෙන් එවිය යුතුය. නව තනතුරු සඳහා ඉල්ලුම් කරන්නාවූද, රාජ්‍ය සේවයෙහි දැනට ස්ථිර තනතුරු දරන්නාවූද, නිලධාරීන්ගෙන් යමෙකු නව තනතුරකට තෝරාගනු ලැබුවහොත් ඒ සඳහා ඔවුන් මුදාහැරිය හැකිද නොහැකිද යන්න එම නිලධාරීන් සේවයෙහි යෙදී සිටින දෙපාර්තමේන්තුවල ප්‍රධානයන් විසින් ඔවුන්ගේ අයදුම්පත් ඉදිරිපත් කරන විට සඳහන් කළ යුතුය.

7 : 2 නියමිත වේලාවක නියමිත ස්ථානයකදී සම්මුඛ පරීක්ෂණයක් සඳහා පෙනී සිටින ලෙස අයදුම්කරුවන්ට නියම කරනු ලැබිය හැක. මේ සම්බන්ධයෙන් පැමිණීමට සිදුවන ගමන් වියදම් හෝ වෙනත් වියදම් ආදියත් ගෙවනු නොලැබේ.

7 : 3 යම්කිසි අයදුම්කරුවකු නිර්දේශ කිරීමට අදහස් කරන කෙනෙකු විසින් අයදුම්කරුට චරිත සහතිකයක් දීමෙන් එසේ කළ යුතුය. යම් අයදුම්කරුවකු තෝරා ගන්නා පරිද්දෙන් කවර අන්දමේ වුව අයථා අනුග්‍රහයක් ඇතිම හෝ එහිලා යම් බලපෑමක් කිරීමට තැත් කිරීම හෝ එම අයදුම්කරු නුසුදුස්සෙකු කරනු ලැබීමට හේතු වනු ඇත.

7 : 4 අයදුම්කරුවකුගේ අයදුම් පතෙහි කිසියම් සාවද්‍ය ප්‍රකාශයක් තිබෙන බැව් ඔහු තෝරා ගැනීමට කලින් දැනගන්නට ලැබිණි නම් ඒ හේතුවෙන්ම ඔහු එම තනතුරට නුසුදුස්සෙකු බවට පත් කරනු ලැබීමටත්, තෝරා ගැනීමෙන් පසු ඒ බව අනාවරණය වුණි නම් ඔහු රාජකාරියෙන් පහකරනු ලැබීමටත් ඉඩ තිබේ.

7 : 5 මෙම දැන්වීමෙහි සඳහන් වන නියමයන්ට සෑම අතින්ම අනුකූල නොවන අන්දමේ අයදුම් පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**8. සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාව සඳහා වැටුප යන්නෙහි අර්ථ දැක්වීම :**

8 : 1 සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප යන්නෙන් අදහස් කෙරෙනුයේ ඒකාබද්ධ වැටුප පමණකි. වැඩ බැලීමේ වැටුපක් හෝ දීමනා ආදිය ඊට ඇතුළත් නොවන්නේය.

---

**තැපැල් හා විදුලි සංදේශ දෙපාර්තමේන්තුවේ ඉංජිනේරු කොට්ඨාශයේ, ආමේචර් ඔතන්නෙකුගේ තනතුරු**

තැපැල් හා විදුලි සංදේශ දෙපාර්තමේන්තුවේ, ඉංජිනේරු කොට්ඨාශයේ වායු සමීකරණ අංශයේ, පුහුණු කම්කරු I පන්තියේ I ශ්‍රේණියේ ආමේචර් ඔතන්නෙකුගේ තනතුරක් සඳහා පහත සඳහන් සුදුසුකම් ඇති අයවලුන්ගෙන් අයදුම් පත් කැඳවනු ලැබේ. මෙම නිවේදනයේ පහත දක්වා ඇති ආදර්ශ අයදුම් පතේ ප්‍රකාර පිළියෙල කර ගත් අයදුම් පත් 1975. 04. 28 දින හෝ ඊට පෙර, ලියාපදිංචි කළ තැපෑලෙන් කොළඹ 1, තැපැල් හා විදුලි සංදේශ මූලස්ථාන ගොඩනැගිල්ලේ, 5 වැනි මහලේ, ප්‍රධාන විදුලි සංදේශ ඉංජිනේරු නැන වෙත ලැබෙන සේ එවිය යුතුයි. අදාළ අයදුම් පත් මෙම කාර්යාලයෙන් සපයනු නො ලැබේ. අයදුම් පත් බහා ලන ලියුම් කවරයේ වම්පස මුදුන් කෙළවරේ "ආමේචර් ඔතන්නෙකුගේ තනතුරු" යනුවෙන් පැහැදිලිව ලිවිය යුතුය.

2. **වැටුප් පරිමාණය.**— මෙම තනතුර සඳහා නියමිත වාර්ෂික ඒකාබද්ධ වැටුප් ක්‍රමය රුපියල් 3,000—15×90—රු. 4,350.

3. **සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි.**—මෙම තනතුර ස්ථිරය. තෝරාගනු ලැබූ අයදුම්කරු රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට දායක මුදල් ගෙවිය යුතුය. පත්වීම ප්‍රථම වශයෙන් අවුරුදු තුනක පරිවාස කාලයකට යටත් වනු ඇත.

සටහන.—(I) 1971.12.31 දින රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත ස්ථිර තනතුරක් දැරූ යම්කිසි පුද්ගලයෙකු පත් කළහොත් මෙම තනතුරෙහි ද විශ්‍රාම වැටුප් හිමිකම් භුක්ති විඳීමට හැකිවනු ඇත.

(II) විශ්‍රාම වැටුප් සහිත ස්ථිර තනතුරක් දරණ රාජ්‍ය නිලධාරියෙකු තෝරාගනු ලැබුවහොත් පළමුකොට ඔහුගේ පත්වීම, නියමිත කාලයක් සඳහා වැඩ බැලීමේ පදනමක් මත වනු ඇත.

4. **අවශ්‍ය සුදුසුකම්.**—සෑම අයදුම්කරුවෙකු විසින්ම තමා පහත සඳහන් සුදුසුකම්වලින් යුක්ත බවට සාක්ෂි ඉදිරිපත් කළ යුතුය.

(අ) විශිෂ්ඨ චරිතයකින් හා මනා ශරීර සෞඛ්‍යයකින් යුක්ත බව

(ආ) 1975.04.28 වැනි දිනට වයස අවුරුදු 21ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 40කට නොවැඩි විය යුතුය. (දැනටමත් රාජ්‍ය සේවයේ නියුක්ත අයට මෙම උපරිම වයස් සීමාව අදාළ නොවේ)

(ඉ) සිංහල, දෙමළ හෝ ඉංග්‍රීසි සත්වන පන්තිය සමත් විය යුතුය.

(ඊ) (i) II පන්තියේ ආමේචර් ඔතන්නෙකු වශයෙන් යටත් පිරිසෙයින් (සහතික මගින් තහවුරු කෙරෙන) අවුරුදු 5ක පළපුරුද්දක් තිබිය යුතුය.

(ii) භාවිතයට ගැනෙනන හා නානාවිධ වර්ගවල කම්බිවල නම් හා ඒවායේ මිමි ද පිළිබඳව පළපුරුද්දක් තිබිය යුතුය.

(iii) ආමේචර් වියලීම හා වාර්නිස් කිරීම පිළිබඳ ඉන්සියුලේෂන් පරීක්ෂණ ගැන දැනීමක් තිබිය යුතුය.

(iv) නියෝජනය හා නිසේචක යන්ත්‍ර පිළිබඳ දැනීමක් තිබීම කෙරෙහි වඩා සැලකිල්ලක් දක්විය යුතුය.

(v) කොමියුටේටරවල අළුත්වැඩියා කිරීම ගැන දැනීමක් තිබිය යුතුය.

(vi) සියළුම වර්ගවල ආමේචර් පරීක්ෂා කර, ඒවායෙහි දෝෂ තිබෙන තැන් සොයා ගැනීමට පිළිවන් විය යුතුයි.

(vii) ආමේචරයක දඟර ගලවා, නැවත එතීමට පිළිවන්කම තිබිය යුතුයි.

(viii) සාමාන්‍ය ආමේචරයක් එතීමට තිබෙන හැකියාව පිළිබඳ පරීක්ෂණයකට පෙනී සිටිය යුතුව ඇත.

5. ඉල්ලුම්කරුවන් විසින් පහත සඳහන් ලියකියවිලිවල පිටපත් පමණක් (මුල් පිටපත් නොව) ඉල්ලුම් පත්‍රයට අමුණා එවිය යුතුය.

(i) උප්පැන්න සහතිකය (බෞතීස්ම හෝ ආධාර ලබන පාඨශාලා පිළිබඳ ව්‍යවස්ථා සංග්‍රහයේ අවශ්‍යතා සඳහන් නිකුත් කරනු ලබන සහතික හෝ භාරගනු නොලැබේ.)

(ii) උසස්ම අධ්‍යාපන සහතිකය.

(iii) වෘත්තීය සහ/හෝ ශිල්පීය සුදුසුකම් පිළිබඳ සහතිකය සහ

(iv) සිංහලෙන් සමත්වූ උසස්ම විභාගය සඳහන් සහතිකය.

(v) අයදුම්කරුගේ චරිතය, යෝග්‍යතාවය කාර්ය ශූරත්වය සහ තනතුරට පත් කිරීමට ඇති යෝග්‍යතාවය දක්වෙන මෑතකදී ලබාගත් සහතික තුනක් (දැනට රජයේ සේවයේ යෙදී සිටින අයදුම්කරුවන් ගෙන් මෙම අනුඡේදය යටතේ සහතික අනවශ්‍යය.)

සැ. යු.—මෙම ලියකියවිලිවල පිටපත් ඉල්ලුම්කරුවන් වෙත ආපසු එවනු නොලැබේ. මුල් ලියකියවිලි ඉදිරිපත් කළ යුත්තේ සම්මුඛ පරීක්ෂණයට කැඳවූවහොත් හා එවිටය.

6. රජයේ සේවයේ නියුක්ත අයදුම්කරුවන්ගේ අයදුම්පත් එම දෙපාර්තමේන්තු ප්‍රධානීන් මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතුය.

7. නියමිත දිනය ඉක්මවා මෙම කාර්යාලයට ලැබෙන අයදුම්පත් භාරගනු නොලැබේ. තම තමන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානීන් මඟින් නියමිත දිනට පසුව මෙම කාර්යාලයට ලැබෙන අයදුම්කරුවන්ගේ ඉල්ලුම් පත්, එම දෙපාර්තමේන්තු ප්‍රධානීන් විසින් නියමිත දින හෝ ඊට පෙර ලද බව හා ප්‍රමාදවීම ගැන පිළිගත හැකි කරුණු ඉදිරිපත් කරමින් ඒවා පිළිගන්නා මෙන් නිර්දේශ කළහොත් මිස භාරගනු නොලැබේ.

8. ඉල්ලුම් පත් ලැබුන බව දන්වා එවනු නොලැබේ. මෙම දැන්වීමේ සඳහන් නියමයන්ට අනුකූල නොවන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

9. අයදුම්පත් සහ ඒ සම්බන්ධ සෙසු ලියකියවිලි එවිය යුත්තේ ප්‍රධාන විදුලි සංදේශ ඉංජිනේරු නමට මිස මෙම දෙපාර්තමේන්තුවේ අන් කිසිදු නිලධාරියෙකුගේ පෞද්ගලික නමට නොවේ.

එච්. ඩී. එස්. ඒ. ගුණවර්ධන,
ප්‍රධාන විදුලි සංදේශ ඉංජිනේරු.

1975 මාර්තු මස 12 වන දින,
කොළඹ 1,
තැපැල් හා විදුලි සංදේශ මූලස්ථානයේ
5 වන මහලේ
ප්‍රධාන විදුලි සංදේශ ඉංජිනේරු කාර්යාලයේදීය.

### ආදර්ශ අයදුම් පත්‍රය

තැපැල් හා විදුලි සංදේශ දෙපාර්තමේන්තුවේ ඉංජිනේරු අංශයේ පුහුණු කම්කරු I පන්තියේ II ශ්‍රේණියේ ආමේචර් ඔතන්නකුගේ තනතුර

1. සම්පූර්ණ නම (පැහැදිලි අකුරෙන්) :

(අ) පෙළපත් නම :———.

(ආ) වෙනත් නම් :———.

2. (අ) ස්ථිර ලිපිනය :———.

(ආ) කාර්යාලීය ලිපිනය :———.

3. (අ) උපන් දිනය හා උපන් ස්ථානය :———.

(ආ) 1975.04.28 දිනට වයස අවු.——, මාස :——, දින :——
(උප්පැන්න සහතිකයේ පිටපතක් ඇමිණිය යුතුය).

4. (අ) ජාතිය :———.

(ආ) ඔබ ලංකාවේ පුරවැසියෙක් ද ?

(i) පෙළපතින් ද ? :———.

(ii) ලියාපදිංචි කිරීමෙන් ද ? :———.

5. විවාහක/අවිවාහක ද යන වග :———.

6. පහත සඳහන් අය උපන් ස්ථානය :———.

(අ) ඉල්ලුම්කරුගේ පියා :———.

(ආ) ඉල්ලුම්කරුගේ පිය පාර්ශ්වයේ මුත්තා :———.

(ඇ) ඉල්ලුම්කරුගේ පිය පාර්ශ්වයේ මී මුත්තා :———.
(ඉල්ලුම්කරු ලංකාවේ උපන්නේ නම් (අ) හෝ (ආ) සහ (ඇ) හෝ සම්පූර්ණ කරන්න. ඉල්ලුම්කරු ලංකාවේ උපන්නේ නොවන්නේ නම් (අ) (ආ) හෝ (ආ) සහ (ඇ) සම්පූර්ණ කළ යුතුයි)

7. (අ) අධ්‍යාපන සුදුසුකම් :———.

(ආ) කාර්මික සුදුසුකම් :———.
(මෙම තනතුරට අදාල ගැසට් නිවේදනයේ 4 ඡේදය පිළිබඳ විස්තර සහතික පිටපත් ඇමිණිය යුතුයි)

8. (අ) කලින් කර ඇති රජයේ සේවය පිළිබඳ සම්පූර්ණ විස්තර හා එයින් අස්වීමට නියම හේතු දක්වන්න.

(ආ) කලින් කර ඇති යුද්ධ සේවය (ඇත්නම් පමණයි) විස්තර සහ එයින් අස්වූයේ කවර හේතුන් නිසාද යන වග සඳහන් කරන්න.

9. අපරාධ වරදකට උසාවියකදී දඬුවම් ලැබී තිමෙනම් වරද හා දඬුවම පිළිබඳ විස්තර.

10. චරිත සහතික ලබාගන්නා ලද අයගේ නම් හා පදවිනාමය :

1.
2.
3.

මා විසින් ඉහත සපයා ඇති විස්තර සත්‍යවූද, නිවැරදි වූ ද විස්තර බව මෙයින් සහතික කරමි. එසේම මේ ඉල්ලුම් පත්‍රයෙහි සඳහන් කිසියම් විස්තරයක් අසත්‍ය හෝ වැරදි හෝ එම තනතුර සඳහා තෝරා ගැනීමට පෙර අනාවරණය වුවහොත් තෝරා පත් කර ගැනීමට නුසුදුස්සෙකු බවත් අසත්‍ය තොරතුරක් මා සපයා තිබෙන බව පත්වීම ලැබීමෙන් පසු හෙළිදරව් වුවහොත් කිසිම වන්දියක් නොමැතිව සේවයෙන් පහකරනු ලබන බවත් මම හොඳාකාරව දනිමි.

ඉල්ලුම්කරුගේ අත්සන

දිනය :———.

### දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය

1. ........................ මහතා මෙම දෙපාර්තමේන්තුවේ සේවයේ නියුක්තව සිටින්නෙකු බව ද,

2. මොහුගේ වැඩ හා හැසිරීම සතුටුදායක බව ද,

3. මොහුගේ අයදුම් පතෙහි දැක්වෙන විස්තර මෙම දෙපාර්තමේන්තුවේ ඇති ලේඛන අනුව නිවැරදි බව හා මෙම තනතුරට අදාල ගැසට් නිවේදනයේ 4 වැනි ඡේදයේ දැක්වෙන පරිදි මෙම තනතුර සඳහා අයදුම් කිරීමට මොහුට සුදුසුකම් ඇති බවද මෙයින් සහතික කරමි.

අත්සන,
නම :
තනතුර :
———වෙනුවට,
දෙපාර්තමේන්තුවේ/ආයතන ප්‍රධානියාගේ
තනතුරු නාමය

දිනය :———.

4-9—75.04.04 දින අංක 158 දරණ ගැසට් පත්‍රය

---

### තැපැල් සහ විදුලි සංදේශ දෙපාර්තමේන්තුව

මහයියාව "ඒ" ශ්‍රේණියේ උප තැපැල් කාර්යාලයේ උප තැපැල් ස්ථානාධිපති ධූරය

මහයියාව උප තැපැල් කාර්යාලයට උප තැපැල් ස්ථානාධිපති වරයෙකුගේ තනතුරක් සඳහා ඉල්ලුම් පත් කැඳවනු ලැබේ.

1. වයස් සීමාව :

1975. 05. 02 වැනි දිනට ඉල්ලුම්කරුවන් ස්ත්‍රී/පුරුෂ දෙපක්ෂයම අවුරුදු 21ට වැඩි සහ අවුරුදු 45 අඩු ශ්‍රී ලංකාවාසීන් විය යුතුය.

2. අධ්‍යාපන හා වෙනත් සුදුසුකම් :

(i) ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන්/අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයෙන් සිංහල/දෙමළ භාෂාව සහ අංක ගණිතය/ශුද්ධ ගණිතය/වාණිජ අංක ගණිතය/උසස් ගණිතය/ව්‍යා. ගණිතය/ගණකාධිකරණය ඇතුළුව ගුටත් පිරිසෙයින් විෂයයන් තුනකින් ලබා ගත් සාමාර්ථය ලබා සිටිය යුතුය.

(ii) පදිංචිය පිළිබඳ සුදුසුකම්.—ඉල්ලුම්කරුවන් අවුරුදු 10 ක් හෝ ඊට වැඩි කාලයක සිට මහනුවර මහ නගර සභා ප්‍රදේශය තුළ ස්ථිර පදිංචිකරුවන් විය යුතුය. උප තැපැල් කාර්යාලය පිහිටි නාගරික කොට්ඨාශය තුළ හෝ ඊට ඉතා මත් ආසන්න කොට්ඨාශය තුළ හෝ පදිංචිකරුවනට අනුග්‍රහයක් දක්වනු ලැබේ.

(iii) කාර්යාලසීය ඉඩකඩ.—මහයියාව උප තැපැල් කාර්යාලය පවත්වාගෙන යාමට සුදුසු ගොඩනැගිල්ලක් දැනට මෙම කාර්යාලයය පිහිටි ස්ථානයට ආසන්නව ඉල්ලුම්කරුවන් විසින් ඉදිරිපත් කළ යුතුය.

වැටුප්.—අඩුම මාසික ඒකාබද්ධ වැටුප රු. 233 කි. මේ සීමාව ඉක්මවා දීමනා ගෙවන්නේ නම්, ඒවා ගෙවනු ලබන්නේ එම කාර්යාලයේ කෙරෙන වැඩ ප්‍රමාණය අනුවය. ජීවනාධාර හා විශේෂ ජීවනාධාර ගෙවනු නොලබන අතර, එම ගෙවීම්ද ඒකාබද්ධ වැටුපට ඇතුළත්වේ. ස්ථිර සේවයේ සිටින උප තැපැල් ස්ථානාධිපතීන්ට නිවාඩු දීමනා සඳහා හිමිකම් ලැබේ. (සියළු දීමනා සහිත රු. 250 හෝ

ඊට අඩු මාසික වැටුප් ලබන උප තැපැල් ස්ථානාධිපතීන්ට රු. 7.50 ක විශේෂ දීමනාවක් ද ගෙවනු ලැබේ.

4. අයදුම්පත්.—මහනුවර (මධ්‍යම) කොට්ඨාශයේ ප්‍රාදේශීය තැපැල් අධිකාරි කාර්යාලයෙන් ඉල්ලුම්පත් සඳහා රු. 2ක මුද්දර එවා මුද්‍රිත ආකෘති පත්‍ර ලබාගෙන සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත් 75. 05. 02 දින හෝ ඊට ප්‍රථම ඔහු වෙත ලැබෙන්න සැලැස්විය යුතුයි.

මේ සඳහා වැඩිදුරටත් විස්තර (මහනුවර) (මධ්‍යම) ප්‍රාදේශීය තැපැල් අධිකාරි තැනගෙන් ලබා ගත හැකිය.

ඒ. ආර්. ඇම්. ජයවර්ධන,
පෝස්ට් මාස්ටර් ජනරාල් සහ විදුලි සන්දේශ අධ්‍යක්ෂ.

4-77—75.04.04 දින අංක 158 දරණ ගැසට් පත්‍රය

---

තැපැල් සහ විදුලි සංදේශ දෙපාර්තමේන්තුව

මයිලගස්තැන්න 'ඒ' ශ්‍රේණියේ උප තැපැල් කාර්යාලයේ උප තැපැල් ස්ථානාධිපති ධුරය

මයිලගස්තැන්න "ඒ" ශ්‍රේණියේ උප තැපැල් කාර්යාලයේ උප තැපැල් ස්ථානාධිපති වරයෙකුගේ තනතුරක් සඳහා ඉල්ලුම් පත් කැඳවනු ලැබේ.

1. වයස් සීමාව.—1975. 04.15 වැනි දිනට ඉල්ලුම්කරුවන් ස්ත්‍රී/ පුරුෂ දෙපක්ෂයෙන්ම වයස අවුරුදු 21ට නො අඩු හා අවුරුදු 45ට නොවැඩි ශ්‍රී ලංකා වාසීන් විය යුතුය.

2. අධ්‍යාපන හා වෙනත් සුදුසුකම් :—

(i) ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන්/අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයෙන් සිංහල/දෙමළ භාෂාව සහ අංක ගණිතය/ශුද්ධ ගණිතය/වාණිජ අංක ගණිතය/උසස් ගණිතය/ව්‍යවහාරික ගණිතය/ගණකාධිකරණය ඇතුළු යටත් පිරිසෙයින් විෂයයන් තුනකින් ලබාගත් සාමාර්ථ්‍ය ලබා සිටිය යුතුය.

(ii) පදිංචිය පිළිබඳ සුදුසුකම්.—ඉල්ලුම්කරුවන් අවුරුදු 10 ක් හෝ ඊට වැඩි කාලයක් සිට බදුල්ල මහ නගර සභා ප්‍රදේශය තුළ ස්ථිර පදිංචිකරුවන් විය යුතුය. උප තැපැල් කාර්යාලය පිහිටි නාගරික කොට්ඨාශය තුළ හෝ ඊට ඉතා මත් නුදුරු කොට්ඨාශය තුළ හෝ පදිංචිකරුවනට අනුග්‍රහයක් දක්වනු ලැබේ.

(iii) කාර්යාලයීය ඉඩකඩ.—මයිලගස්තැන්න "ඒ" ශ්‍රේණියේ උප තැපැල් කාර්යාලය පවත්වාගෙන යාමට සුදුසු ගොඩනැඟිල්ලක් දැනට මෙම කාර්යාලය පිහිටි ස්ථානයට ආසන්නවම ඉල්ලුම්කරුවන් විසින් ඉදිරිපත් කළ යුතුය.

3. වැටුප්.—අඩුම මාසික ඒකාබද්ධ වැටුප රු. 233කි. මේ සීමාව ඉක්මවා දීමනා ගෙවන්නේ නම් ඒවා ගෙවනු ලබන්නේ එම කාර්යාලයේ කෙරෙන වැඩ ප්‍රමාණය අනුවය. ජීවනාධාර හා විශේෂ ජීවනාධාර ගෙවනු නො ලබන අතර, එම ගෙවීම් ද ඒකාබද්ධ වැටුපට ඇතුළත් වේ. ස්ථිර සේවයේ සිටින උප තැපැල් ස්ථානාධිපතීන්ට නිවාඩු දීමනා සඳහා හිමිකම් ලැබේ. (සියළුම දීමනා සහිත රු. 250 හෝ ඊට අඩු මාසික වැටුප් ලබන උප තැපැල් ස්ථානාධිපතීන්ට රු. 7,50ක විශේෂ දීමනාවක්ද ගෙවනු ලැබේ.)

4. අයදුම්පත්.—බණ්ඩාරවෙල ප්‍රාදේශීය තැපැල් අධිකාරි කාර්යාලයෙන් ඉල්ලුම්පත් සඳහා රු. 2ක මුද්දර එවා මුද්‍රිත ආකෘති පත්‍ර ලබාගෙන, සම්පූර්ණ කරණ ලද ඉල්ලුම්පත් 1975. 04. 15 දින හෝ ඊට ප්‍රථම බණ්ඩාරවෙල ප්‍රාදේශීය තැපැල් අධිකාරි වෙත ලැබෙන්නට සැලැස්විය යුතුය.

මේ සඳහා වැඩිදුරටත් විස්තර බණ්ඩාරවෙල ප්‍රාදේශීය තැපැල් අධිකාරි තැනගෙන් ලබාගත හැකිය.

ඒ. ආර්. ඇම්. ජයවර්ධන,
පෝස්ට්මාස්ටර් ජනරාල් සහ විදුලි සංදේශ අධ්‍යක්ෂ.
(ප්‍රානැඅ(බව) ල 1493/75)

4-75—75.04.04 දින අංක 158 දරණ ගැස්ට් පත්‍රය

---

ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ 'උප්පුවැලි' කොට්ඨාශයේ උප්පැන්න හා මරණ සහ ත්‍රිකුණාමලය කොට්ඨාශයේ විවාහ (සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් ධුරය

උප්පුවැලි 'උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ කොට්ඨාශය තුළ ස්ථිර පදිංචියක් ඇත්තාවූ හෝ, එහි පදිංචි වී කොට්ඨාශය තුළ සැහෙන දේපලක් හිමිව සිටින, ගම්වාසීන්ගේ සැලකුම්ද ලබන, ඉල්ලුම්පත් භාරගන්නා අවසාන දිනට වයස අවුරුදු විසිඑකට නොඅඩු ස්ත්‍රී පුරුෂ දෙපක්ෂයෙන්ම ඉහත සඳහන් ධුරය සඳහා ඉල්ලුම්පත් කැඳවනු ලැබේ. රජයේ ස්ථිර සේවයේ නිරුතු අයදුම්කරුවන් සඳහා මෙම වයස් සීමාව අදාල නොවේ.

2. මෙම ධුරය සඳහා ඉදිරිපත් වන අයට තිබිය යුතු අධ්‍යාපනික හා අනෙකුත් සුදුසුකම් ආදිය පිළිබඳ සියලු විස්තර මෙම කාර්යාලයේ සහ ප්‍රාදේශීය ආදායම් පාලක නිලධාරි කාර්යාලය, ග්‍රාමසේවක කාර්යාලය, පළාත් පාලන ආයතන කාර්යාල, ග්‍රාමීය උසාවි, තැපැල් කාර්යාල, පොලිස් ස්ථාන සහ ප්‍රජාමණ්ඩල, ප්‍රසිද්ධ වෙළඳ පොලවල් සහ සමූපකාර සමිති ආදී කොට්ඨාශයේ ප්‍රසිද්ධ ස්ථාන සහ කාර්යාලවල ප්‍රදර්ශනය කර ඇති දැන්වීම්වල ඇතුළත් වේ.

3. සියලුම ඉල්ලුම් පත් මෙම කාර්යාලයෙන් ලබා ගතහැකි ආකෘති පත්‍රවල සකස් විය යුතු අතර, ඒවා 1975 අප්‍රේල් මස 21 දිනට හෝ ඊට පෙර මා වෙත ලැබෙනසේ ලියාපදිංචි තැපැලෙන් එවිය යුතුය.

තිස්ස දේවේන්ද්‍ර,
දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්.

1975 මාර්තු මස 10 දින,
ත්‍රිකුණාමලයේ දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයේදීය.

4-24—75.04.04 දින අංක 158 දරණ ගැසට් පත්‍රය

---

ශ්‍රී ලංකා ගුවන් හමුදාව

නිලධාරි පුරප්පාඩු—වෛද්‍ය නිලධාරීන්

1. ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ වෛද්‍ය නිලධාරි පුරප්පාඩු සඳහා අයදුම් පත්‍ර කැඳවනු ලැබේ.

2. තෝරා ගනු ලැබූ අපේක්ෂකයින්ට ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ ප්ලයිට් ලෙප්ටිනන්ට් නිලයේ නිත්‍ය අධිකාරියක් ලැබෙනවා ඇත.

3. වෛද්‍ය නිලධාරින්ගේ වැටුප, සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවේ වෛද්‍ය නිලධාරීන්ට අදාළ වැටුප් ප්‍රමාණය වේ. තවද, පහත සඳහන් දීමනාද ගෙවනු ලැබේ.

(අ) සේවා දීමනා—ප්ලයිට් ලෙප්ටිනන්ට් සහ ස්කොඩ්‍රන් ලීඩර්—මසකට රු. 180 ක් බැගින්, විංකොමාන්ඩර්—මසකට රු. 225 ක්.

(ආ) මීට සමාන සුදුසුකම් ඇති රජයේ වෛද්‍ය නිලධාරීන්ට අදාල පරිදි විශ්‍රාම වැටුප් අහිමි දීමනාවක් ගෙවනු ලැබේ.

(ඇ) ගුවන් හමුදා වැටුප් සංග්‍රහයේ දක්වා ඇති පරිදි සුදුසුනා වැටුප් ගෙවනු ලැබේ.

(ඈ) පහත දැක්වෙන පරිදි නිල ඇඳුම් දීමනාවක් ගෙවනු ලැබේ. සිර්ම කලාපිය ඇඳුම් සඳහා රු. 1,000 ක මූලික දීමනාවක්. මීට අමතරම මසකට රු. 25 ක් බැගින් නිල ඇඳුම් නඩත්තු කිරීමේ දීමනාවක්ද ගෙවනු ලැබේ.

(ඉ) විවාහ වී පිට වාසය කරන අයට රු. 75 ක මාසික "බැට්මන්" සේවා දීමනාවක් ගෙවනු ලැබේ. ඇතුළත වාසය කරන නිලධාරීන්ට, මෙස් භෝජනාගාරය තුළදී නොමිළයේ "බැට්මන්" සේවයක් සපයනු ලැබේ.

4. (අ) තෝරාගනු ලබන අපේක්ෂකයින් අධිකාරියට පත්කිරීමට ප්‍රථම දින වන තෙක්, විශ්‍රාම වැටුප් හිමි රජයේ තනතුරක් දරමින් සිටිගේ නම්, කලින් කල ගැසට් පත්‍රයේ දැන්වීම් පළ කරමින් සංශෝධනය කර ඇති 1941 පෙබරවාරි මස 5 වෙනි දින දරණ විශ්‍රාම වැටුප් සංග්‍රහයේ නියමයන් සහ කොන්දේසි යටතේ ඉදිරියටත් විශ්‍රාම වැටුප් තත්ත්වයේ තබනු ලැබේ.

(ආ) ඉහත 4 (අ) ඡේදයට ඇතුළත් නොවන අපේක්ෂයෙකු වෙතොත්, ඔහු විශ්‍රාම වැටුප් සඳහා හිමිකම් නොලබන නමුත්, විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවේ අංක 3 හා 1972 ජනවාරි 10 වෙනි දින දරණ චක්‍රලේඛයේ සඳහන් පරිදි රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට දායක මුදල් ගෙවිය යුතුය.

5. උසස්වීමේ මතු බලාපොරොත්තු, වැටුප් සහ සේවා කොන්දේසි පිළිබඳ වැඩිදුර විස්තර, කොළඹ 2, ශ්‍රීමත් චිත්තම්පලම් ගාඩිනර් මාවතේ, ශ්‍රී ලංකා ගුවන් හමුදා මූලස්ථානයෙන් ලබාගත හැක.

6. අයදුම්කරුවන්ට මෙහි පහත සඳහන් සුදුසුකම් තිබිය යුතුය :—

(අ) පුරවැසිභාවය.—අපේක්ෂකයන් ශ්‍රී ලංකාවේ පුරවැසියන් විය යුතුය.

(ආ) වයස.—අපේක්ෂකයන් 1975 අප්‍රේල් 1 වැනි දිනට වයස අවුරුදු 32 නොඉක්මවා සිටිය යුතුයි.

(ඇ) අධ්‍යාපනික හා වෘත්තීය සුදුසුකම්.—අපේක්ෂකයන් වෛද්‍ය කර්මය සහ ශල්‍ය කර්ම විද්‍යාව පිළිබඳ උපාධියක් හෝ ඊට ඉහළ සුදුසුකමක් ලබා තිබිය යුතු අතර, වෛද්‍ය වෘත්තියෙහි යෙදීසිටීම සඳහා සවිත් පිරිසෙයින් අවුරුදු 2 ක්, ශ්‍රී ලංකා වෛද්‍ය සභාවෙහි ලියාපදිංචි වී සිටිය යුතුයි.

(ඈ) සෞඛ්‍ය තත්ත්වය.—අපේක්ෂකයින් පත්වීමට පෙරාතුව ගුවන් හමුදා පිළිගැල කිරීමක් යටතේ පැවැත්වෙන වෛද්‍ය පරීක්ෂණයකින් සමත් විය යුතුය. (අවම උස අඩි 5 අඟල් 5 යි. බර රාත්තල් 105 යි.)

7. මෙම නිවේදනයේ ‘අ’ පරිශිෂ්ඨයේ දක්වෙන පරිදි අයදුම් පත්‍ර සකස් කළ යුතුයි. මුද්‍රිත අයදුම් පත්‍ර පෝරම නොමැති බැවින් අයදුම්කරුවන් තම තමන්ගේ අයදුම් පත්‍ර සකස් කර ගත යුතුය. නියමිත ආකෘති පත්‍රයට අනුකූල නොවන අයදුම් පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

8. අයදුම් පත්‍ර, කොළඹ, තැ. පෙ. 594, ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ ගුවන් හමුදාපති වෙත ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම් පත්‍ර බහාලන කවරයේ වම් පැත්තේ, උඩ කෙළවරේ, “වෛද්‍ය නිලධාරි සඳහා අයදුම් පත්‍රය” යනුවෙන් සඳහන් කර තිබිය යුතුය. අයදුම් පත්‍ර, 1975 මැයි මස 10 වෙනි දින දවල් 12.00 වනතෙක් භාරගනු ලැබේ.

9. අයදුම් පත්‍ර සමග පහත සඳහන් ලියකියවිලිවල පිටපත්ද (මුල් පිටපත් නොවේ) ඉදිරිපත් කළ යුතුයි.

(අ) අයදුම්කරුගේ උප්පැන්න සහතිකය.

(ආ) ලබාගත් උසස්ම අධ්‍යාපන/වෘත්තීය සුදුසුකම් පිළිබඳ සහතිකය.

(ඇ) අයදුම්කරු පුද්ගලිකව හඳුනන වගකිවයුතු පුද්ගලයන්, සවිත් පිරිසෙයින් දෙදෙනෙකුගෙන් ලබාගත් චරිත සහතික.

(ඈ) අයදුම් පත්‍රයෙහි සඳහන් කර ඇති යම් කරුණක් සනාථ කිරීමට සහතික පත්‍ර තිබේනම් ඒවා.

10. රාජ්‍ය සේවයේ සේවයේ නියුක්තව සිටින නිලධාරීන් විසින් එවන් අයදුම්පත්‍ර සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ මගින් ඉදිරිපත් කළ යුතු අතර, තෝරාගනු ලැබුවහොත්, එම නිලධාරියා මුදා හැරිය හැකි බවට සහතිකයක් අයදුම් පත්‍රයෙහි ඇතුළත් විය යුතුය.

11. තෝරා පත් කර ගනු ලබන අපේක්ෂකයින් විසින්, රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමට සහ විශේෂයෙන්, 1956 අංක 33 දරණ රාජ්‍ය භාෂා පනත ක්‍රියාත්මක කිරීම උදෙසා දැනටමත් පනවා ඇති හෝ මීට පසුව පනවනු ලබන නිතිරීතිවලට අනුකූලව කටයුතු කිරීම අවශ්‍යවේ.

12. ඉහත සඳහන් 6 වෙනි සහ 9 වෙනි ඡේදවල දක්වා ඇති සියලුම අවශ්‍යතාවයන්ට සම්පූර්ණයෙන් අනුකූල නොවන අයදුම් පත්‍ර සලකා බලනු නොලැබේ.

13. කෙළින්ම හෝ වෙනයම් මාර්ගයකින් යම් අනුග්‍රහයක් ලබා ගැනීමට තැත් කිරීම නුසුදුසුකමක් බව අයදුම්කරුවන්ට විශේෂයෙන්ම දන්වා සිටිනු ලැබේ.

14. තෝරා ගැනීම, සම්මුඛ පරීක්ෂණ යනාදිය.—ලැබෙන අයදුම් පත් ගණන අනුව, අවශ්‍ය වුවහොත්, පළමුවෙන් ගුවන් හමුදාවේ මණ්ඩලයක් මගින් ඉහත සඳහන් සුදුසුකම් ඇති අයගෙන් සුදුසු අය තෝරා ගනු ලැබේ, අධිකාරිය ලැබීම උදෙසා යෝග්‍යතාවය මැනීමට ඉන්පසුව අයදුම්කරුවන් පරීක්ෂණයන්ට භාජන විය යුතුය. අවසාන තේරීම කරනු ලබන්නේ, රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශය මගින් පත් කරනු ලබන තේරීමේ මණ්ඩලයක් විසින් මෙම අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයකට භාජනය කිරීමෙන් පසුවය.

15. අයදුම්කරුවන්, කොළඹ දී පැවැත්වෙන සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ. සම්මුඛ පරීක්ෂණය පැවැත්වෙන දිනය, වේලාව සහ ස්ථානය ලිපියකින් දැනුම් දෙනු ලැබේ. මේ සඳහා අයදුම්කරුවන්ට දරන්නට සිදුවන ගමන් වියදම් හෝ වෙනත් වියදම් ගෙවනු නොලැබේ. තෝරාගනු නොලබන අයදුම්කරුවන්ට ඒ බව දන්වනු ලැබේ.

පී. එච්. මෙන්ඩිස්,
එයාර් වයිස් මාර්ෂල්,
ගුවන් හමුදාධිපති.

1975 අප්‍රේල් මස 4 වෙනි දින,
කොළඹ, තැ. පෙ. 594,
ශ්‍රී ලංකා ගුවන් හමුදා මූලස්ථානයේ දීය.

## ‘අ’ පරිශිෂ්ඨය

ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ.............................අධිකාරියන් සඳහා අයදුම් පත්‍රය

(ඉල්ලුම් කරන අංශයේ නම සඳහන් කළ යුතුය.)

1. අගට යෙදෙන නම :————. සෙසු නම් :————.

2. දැනට ලිපිනය :————.
   (i) දුරකථන අංකය :————.
   (ii) කුඩුරු දුම්රිය පොළ :————.
   (iii) කුඩුරු පොලිස් ස්ථානය :————.
   (iv) විදුලි පණිවුඩ කාර්යාලය :————.

3. ස්ථිර වාසස්ථානය :————.
   එහි වාසය කළ කාලය :————.

4. විවාහක තත්ත්වය :————.

5. ආගම :————.

6. මව්පිය විස්තර :————.
   (අ) පියාගේ නම :————.
   උපන් ස්ථානය :————.
   උත්පත්තියෙන් රටවැසි භාවය :————.
   (ආ) මවගේ නම :————.
   උපන් ස්ථානය :————.
   උත්පත්තියෙන් රටවැසි භාවය :————.

7. පාසැල් හා විශ්ව විද්‍යාල චරියා විස්තර :—
   (අ) පාසැලේ නම :————.
   (ආ) ඇතුළත් වූ දිනය :————.
   (ඇ) අස්වූ දිනය :

8. පාසැලෙන් අස්වූ පසු නියුක්තව සිටි රක්ෂාවල් :—
   (අ) ස්වාමියාගේ නම :————.
   (ආ) රක්ෂාවේ ස්වභාවය :————.
   (ඇ) රක්ෂාවෙහි කාලය :————.

9. මීට පෙර තමා සන්නද්ධ සේවයක යම් පුරප්පාඩුවක් සඳහා සම්මුඛ පරීක්ෂණයකට පෙනීසිට තිබේද? උත්තරය ‘ඔව්’ නම් ඉල්ලුම් කළ තනතුර හා දිනය දක්වන්න :————.

10. සිවිල් උසාවියක් හෝ සේවා විනිශ්චය මණ්ඩලයක් මගින් තමා වරදකරු කර තිබේද? උත්තරය ‘ඔව්’ නම් විස්තර දක්වන්න :————.

11. මෙම දැන්වීමෙහි 6 වැනි ඡේදයේ සඳහන් පරිදි අවශ්‍ය සුදුසුකම් :—
   උපන් දිනය :————. වයස :————.
   උපන් ස්ථානය :————.
   පුරවැසි භාවය උත්පත්තියෙන් :————.
   පුරවැසි භාවය දැනට :————.
   (අ) යෝග්‍යතාවය :————.
   (ආ) තමා ලබා ඇති අධ්‍යාපනික සුදුසුකම් :————.
   (එනම් : සුදුසුකම් පිළිබඳව 8 වැනි ඡේදයේ වගන්තිය ප්‍රකාර)
   (ඇ) උස : අඩි :——, අඟල් :——.
   (ඈ) පපුව : අඟල් :————.
   (ඉ) බර : රාත්තල් :————.

12. අතිරේක සුදුසුකම් :————.
   (මෙකී සුදුසුකම් සනාථ කිරීමට අයදුම්කරුට හැකි විය යුතුය.)

13. ක්‍රීඩා දක්ෂතා විස්තර :———.
(කණ්ඩායම් හා තරඟ විස්තර දක්වා, දිනයන් ද, ලබා ගත් දක්ෂතාවයන් ද සඳහන් කරන්න.)

14. පාසැලේ දී හෝ විශ්ව විද්‍යාලයේ දී ලබාගත් අතිකුත් දක්ෂතාවයන් :———.

15. සම්බන්ධ සේවයක, නිත්‍ය හෝ ස්වේච්ඡා හෝ බාලදක්ෂ ආයතනයක සේවය තිබේ නම්, ඒ පිළිබඳ විස්තර :———.

16. යම්කිසි විශේෂ සුදුසුකම් :———.

17. මෙම අයදුම්පත සමග එවා ඇති ලියකියවිලි :———.
(පිටපත් පමණක් අමුණා එවිය යුතුය.)

18. චරිත සහතික ලබාගත් අයගේ නම් :———.

19. මෙම අයදුම් පත්‍රයට අමුණා ඇති වෙනත් ලියකියවිලි :———.

———,
අයදුම්කරුගේ අත්සන.

දිනය :———.

4-7—75.04.04 දින අංක 158 දරණ ගැසට් පත්‍රය

---

**කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ කෘෂිකර්ම උපදේශක තනතුරු**

කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ කෘෂිකර්ම උපදේශක තනතුරු සඳහා ඉල්ලුම්පත් මෙයින් කැඳවනු ලැබේ. මෙහි පහත දැක්වෙන ආදර්ශ ආකෘතියට අනුව සකස් කළ ඉල්ලුම්පත් 1975 අප්‍රේල් මස 30 දින හෝ ඊට පෙර පේරාදෙණියේ, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ (පරිපාලන) වෙත ලැබෙන සේ එවිය යුතුයි.

**සංලක්ෂ්‍යය :**

(i) ආදර්ශ ආකෘති පත්‍රය අනුව පිළිවෙල කරනු නොලබන අයදුම් පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

(ii) ඉල්ලුම් පත්‍රයක් හෝ ඒ හා සම්බන්ධ ලියමනක් හෝ තැපෑලේ දී නැතිවූ බවට හෝ ප්‍රමාද වූ බවට හෝ කෙරෙන පැමිණිලි ගැන සලකා බැලිය නොහැකිය. අවසාන දිනය දක්වා ඉල්ලුම්පත් ප්‍රමාද කිරීමෙන් සිදුවිය හැකි පාඩු අයදුම්කරුවන් විසින් විඳ දරාගත යුතුය.

**සේවයේ නියුක්ත කරවීමේ නියමයන් හා සේවා කොන්දේසි :—**

(අ) (i) මෙම තනතුරු ස්ථිරය. රජයේ අර්ථ සාධක අරමුදලට දායක මුදල් ගෙවිය යුතුය. මෙම පත්වීම ප්‍රථම වශයෙන් දෙනු ලබන්නේ අවුරුදු 3 ක පරීක්ෂණ කලයක් මතය.

(ආ) තාවකාලික තනතුරුවලට පත්කිරීම හුදෙක්ම තාවකාලික පදනමක් මත කෙරෙනවා ඇත. එසේ පත්වූවන්ට රජය යටතේ ස්ථිර පත්වීම් ලැබීමට කිසිදු හිමිකමක් පෑමට අයිතියක් නොමැති බව පැහැදිලිවම තේරුම් ගත යුතුයි. මෙම පත්කිරීම් රජයේ අභිමතය පරිදි ඕනෑම අවස්ථාවකදී අවසන් කළ හැකිය. කෙසේ වෙතත් තාවකාලික පදනමක් මත බඳවා ගන්නා කෘෂිකර්ම උපදේශකයින්, ඔවුන්ගේ තාවකාලික සේවා කාලය අවසානවීමට පෙර ඇතිවන ස්ථිර තනතුරුවල පුරප්පාඩු පිරවීම සඳහා බඳවා ගැනීමට සලකා බලනු ලැබේ.

(ii) තෝරා ගන්නා ලද අයදුම්කරුවන් පත්වීම ලබා අවුරුදු 3 ක් ඇතුළතදී සිංහල පිළිබඳ ප්‍රවීණතාවයක් ලබා සිංහල ප්‍රවීණතා පරීක්ෂණයන්ගෙන් සමත්විය යුතුයි. මුල් වර්ෂය තුළ දෙමළෙන් වැඩ කිරීමේ දැනුමක් ද ලබාගත යුතුය.

3. වැටුප් සහ දීමනා.—මෙම තනතුරුවලට අදාළ ඒකාබද්ධ වැටුප් ක්‍රමය පහත දැක්වේ :—අවුරුද්දකට රු. 3,864 සිට රු. 144 වැඩිවීම් 19 ක් සහ රු. 180 වැඩිවීම් 4 කින්, රු. 7,320 දක්වා වැඩිවන (රු. 4,584 හා රු. 6,024 ට පෙර කාර්යක්ෂමතා කඩඉම් ඇත) වැටුප් ක්‍රමයක් මීට අයත්ය.

පළමුවැනි පන්තිය.—අවුරුද්දකට රු. 7,500 සිට රු. 180 වේ වැඩිවීම් 3 කින් හා රු. 240 වැඩිවීම් 2 කින් රු. 8,520 දක්වා වැඩිවේ.

විශේෂ පන්තිය.—අවුරුද්දකට රු. 8,760 සිට රු. 240 වැඩිවීම් 3 කින්, රු. 9,480 දක්වා වැඩිවේ.

**සටහන :**

(i) පිළිගත් විශ්ව විද්‍යාලයක කෘෂිකර්මය පිළිබඳ උපාධිධරයන් හා කෘෂිකර්ම විද්‍යාලයෙන් ජ්‍යෙෂ්ඨ සහතික පත්‍ර විභාගයෙන් 1 වැනි හෝ 2 වැනි පෙළ සාමාර්ථය ලත් තෝරාගත් අපේක්ෂකයින් රු. 3,864 ආරම්භක ඒකාබද්ධ වාර්ෂික වැටුපේ තබනු ඇත. මේ සියලු දෙනාම පත්වීමේ දින සිට වර්ෂයක් ඇතුළත දෙපාර්තමේන්තු ජාතික භාෂා පරීක්ෂණයෙන් සමත්විය යුතුය, මෙම පරීක්ෂණයෙන් නියමිත කාලය තුළ සමත්වීමට අපොහොසත් වුවහොත් ඊළඟ වැටුප් වැඩිවීම ප්‍රමාද කිරීමට හේතුවේ.

(ii) කෘෂිකර්ම විද්‍යාලයේ ජ්‍යෙෂ්ඨ සහතික පත්‍ර විභාගයෙන් "සාමාන්‍ය" සාමාර්ථය ලත් තෝරාගත් අපේක්ෂකයින්ට වර්ෂයකට රු. 3,180ක ඒකාබද්ධ වැටුපක් ගෙවන අතර, දෙපාර්තමේන්තු ආධුනිකයින්ගේ විභාගයේ 1 වෙනි කොටසින් සමත්වූ දින සිට රුපියල් 3,864 ක ඒකාබද්ධ වාර්ෂික වැටුප් තලයේ තබනු ලැබේ. මේ අයද පත්වීමේ දින සිට වර්ෂයක් ඇතුළත දෙපාර්තමේන්තු ජාතික භාෂා පරීක්ෂණයකින් සමත් විය යුතු අතර, නියමිත කාලය තුළ එයින් සමත්වීමට අපොහොසත් වුවහොත් ඊළඟ වැටුප් වැඩිවීම ප්‍රමාද කිරීමට හේතුවේ. පත්වීමේ දින සිට වර්ෂයක් ඇතුළත ආධුනිකයින්ගේ විභාගයේ 1 වන කොටසින් සමත් නොවන අය රු. 3,864 ඒකාබද්ධ වැටුප් තලයේ තැබීමට එම විභාගයෙන් සහ දෙපාර්තමේන්තු ජාතික භාෂා පරීක්ෂණයෙන් ද සමත් විය යුතුයි.

4. අවශ්‍ය සුදුසුකම්.—සෑම අපේක්ෂකයෙකුම පහත සඳහන් සුදුසුකම් ඇති බවට සතුටුදායක සාක්ෂි ඉදිරිපත් කළ යුතුය :—

(අ) විශිෂ්ඨ චරිතයකින් හා මනා ශාරීරික සෞඛ්‍යයෙන් යුත් බව,

(ආ) 1975 මාර්තු මස 31 දිනට වයස අවුරුදු 35 ට නොවැඩි බව. (දැනට රජයේ ස්ථිර තනතුරු දරන්නන්ගේ වයස් සීමාව නොසලකා ඉල්ලුම්පත් භාරගනු ලැබේ).

(ඇ) පිළිගත් විශ්ව විද්‍යාලයක කෘෂිකර්මය පිළිබඳ උපාධිධරයෙක්,

හෝ

(ඈ) (i) ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතිකය හෝ සිංහල භාෂාව හෝ දෙමළ භාෂාව, අංක ගණිතය හෝ ගණිතය සහ වෙනත් විෂයයන් හතරකින් සාමාර්ථය ලබා ඉන් විෂයයන් පහක් එකම විභාගයේදී එකවරම සමත්වී ඇති අධ්‍යයන පොදු (සාමාන්‍ය) සහතිකය හෝ ඒ හා සමාන හෝ ඊට උසස් විභාගයකින් සාමාර්ථයක්

සහ

(ii) පේරාදෙණියේ හෝ කුණ්ඩසාලේ කෘෂිකර්ම විද්‍යාලයීය ජ්‍යෙෂ්ඨ සහතිකය දරන්නකු විය යුතුය.

හෝ

(ඉ) දෙපාර්තමේන්තුවේ ශිෂ්‍යත්වයක් ලබා පේරාදෙණියේ හෝ කුණ්ඩසාලේ කෘෂිකර්ම විද්‍යාලයේ ඩිප්ලෝමා සහතිකය ලැබුවාවූ දෙපාර්තමේන්තු නිලධාරියෙකු බව.

සැ. යු.—1974 දෙසැම්බර් මස පැවැත්වූ ශ්‍රී ලංකා කුණ්ඩසාලේ කෘෂිකර්ම විද්‍යාලයයේ අවසාන පරීක්ෂණයට පෙනී සිට ප්‍රතිඵල බලාපොරොත්තුවෙන් සිටින අයගෙන් ද අයදුම්පත් භාරගනු ලැබේ. එහෙත් කෘෂිකර්ම විද්‍යාලයයේ ප්‍රතිඵල නිකුත් කල වහාම එම පරීක්ෂණයෙන් තමා සමත් වී තිබේද යන බව ඔවුන් විසින් මා වෙත දැනුම් දිය යුතුය. නොඑසේ නම් ඔවුන්ගේ ඉල්ලුම්පත් සලකා බලනු නොලැබේ.

5. අයදුම්කරුවන් තමන්ගේ ඉල්ලුම්පත්වලට පහත සඳහන් සහතිකවල පිටපත් (මුල් පිටපත් නොවේ) අමුණා එවිය යුතුය :—

(අ) උප්පැන්න සහතිකය. (සැ. යු.—අධ්‍යාපන රෙගුලාසි පරිදි උපකෘත පාසැලක ප්‍රයෝජනය සඳහා ඉදිරිපත් කරන ලද සහතික හෝ බව්තීස්ම සහතික භාරගනු නොලැබේ.)

(ආ) උසස්ම අධ්‍යාපනික සහ/හෝ වෘත්තීය සුදුසුකම් පිළිබඳ සහතිකය.

(ඇ) සිංහල විෂයයන් සමත් උසස්ම විභාගය පිළිබඳ සහතිකය.

(ඈ) ළඟදී ලබාගත් චරිත සහතික දෙකක්. (දැනට රජයේ සේවයේ නියුක්ත අයදුම්කරුවන්ගෙන් මෙම උපවගන්තිය යටතේ සහතික ඉදිරිපත් කිරීමට උවමනා නැත.)

සංලක්ෂ්‍යය.—මෙම සහතිකපත්‍ර පිටපත් ආපසු එවනු නොලැබේ.

6. රාජ්‍ය සේවයේ නියුක්ත අයදුම්කරුවන් තම ඉල්ලුම් පත්‍ර ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතුය. නියමිත දිනට පසුව මෙම කාර්යාලයට ලැබෙන එවැනි අයදුම්කරුවන්ගේ ඉල්ලුම් පත් එම දෙපාර්තමේන්තු ප්‍රධානීන් විසින් නියමිත දින හෝ ඊට පෙර ලද බවත්, ප්‍රමාදවීම ගැන පිළිගත හැකි කරුණු ඉදිරිපත් කරමින් පිළිගත යුතුයැයි නිර්දේශ නොකරන හොත් සලකා බලනු නොලැබේ.

7. අයදුම්පත් හා ඒ සම්බන්ධව අනෙක් ලියකියවිලි සියල්ලක්ම පේරාදෙණියේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ (පරිපාලන) ට හැර මෙම දෙපාර්තමේන්තුවේ කිසිම නිලධාරියෙකුගේ නමට පුද්ගලිකව නොඑවිය යුතුය.

8. මෙම ගැසට් පත්‍රයේ I වැනි කොටසේ (IIඅ) ඡේදයේ අරම්භයේ සඳහන් රාජ්‍ය සේවා තනතුරුවලට කරන පත් කිරීම් සම්බන්ධයෙන් අදාල වන පොදු කොන්දේසිවලට අවධානය යොමු කරනු ලැබේ.

9. අයදුම් පත් ලැබුණු බව දන්වනු ඇත.

ඊ. එෆ්. එල්. අබේරත්න,
කෘෂිකර්ම අධ්‍යක්ෂ.

1975 මාර්තු මස 18 වනදා,
පේරාදෙණියේ, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ දී ය.

ආදර්ශ ඉල්ලුම් පත්‍ර පෝර්මය

**කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ කෘෂිකර්ම උපදේශක තනතුරු**

1. සම්පූර්ණ නම :——.
   (අ) පෙලපත් නාමය :————.
   (ආ) වෙනත් නම් :————.
2. ලිපිනය :————.
3. උපන් දිනය සහ 1975 අප්‍රේල් මස 30 වැනි දිනට වයස :————
4. ජාතිය සහ එය කෙසේ ලබාගත්තේද යන වග :————.
5. උපන් ස්ථානය :—
   (අ) අයදුම්කරුගේ :————.
   (ආ) ඔහුගේ පියා :————.
   (ඇ) ඔහුගේ පිය පස මුත්තා :————.
   (ඈ) ඔහුගේ පිය පස මී මුත්තා :————.
6. අයදුම්කරු කසාද බැඳලාද, නැද්ද යන වග :————.
7. ලබා ඇති අධ්‍යාපනික හා/හෝ වෘත්තීය සුදුසුකම් (සහතිකවල පිටපත් ඇමිණිය යුතුයි) :————.
8. සිංහල විෂයයෙන් සමත් වී ඇති පරීක්ෂණය (සහතිකවල පිටපත් ඇමිණිය යුතුයි) :————.
9. ඔබ මීට පෙර රජය යටතේ සේවය කර තිබේද? එසේ නම් දැරූ ධුරය සහ ඉන් අස්වීමට හේතු සඳහන් කළ යුතුය :————.
10. යම්කිසි විශේෂ හිමිකම්, සුදුසුකම් හෝ පලපුරුද්දක් ඇතිනම් සඳහන් කරන්න :————.
11. මීට පෙර ඔබ මෙම තනතුරු සඳහා ඉල්ලුම්කර තිබේද? එසේ නම් දින සඳහන් කරන්න :————.
12. යම්කිසි සාපරාධී වරදකට කෙදිනක හෝ උසාවියකදී වැරදිකරුවී ඇත්නම් එම වරද හා ලැබූ දඬුවම පිළිබඳ විස්තර සඳහන් කරන්න :————.
13. චරිත සහතික ඉදිරිපත් කර ඇති අයගේ නම් සහ තනතුරු නාමය (සහතික පිටපත් ඇමිණිය යුතුයි) :————.

ම විසින් මෙම ඉල්ලුම් පත්‍රයේ සඳහන් කරන ලද තොරතුරු සත්‍ය බව සහ නිවැරදි බව සහතික කරමි. එම තොරතුරු අසත්‍ය බව තෝරා ගැනීමට පෙර හෙළිදුවුවහොත් මා නුසුදුස්සෙකු වන බවත්, තෝරා ගැනීමෙන් පසු එසේ වුවහොත් කිසිම වන්දියක් නොමැතිව සේවයෙන් පහ කිරීමට හැකි බවත් මම දනිමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

4-33—75.04.04 දින අංක 158 දරණ ගැසට් පත්‍රය

---

**තැපැල් හා විදුලි සංදේශ දෙපාර්තමේන්තුව**

**අත්තිඩිය 'ඒ' ශ්‍රේණියේ උප තැපැල් කාර්යාලයේ උප තැපැල් ස්ථානාධිපති ධුරය**

අත්තිඩිය උප තැපැල් කාර්යාලයට උප තැපැල් ස්ථානාධිපතිවරයෙකුගේ තනතුරක් සඳහා ඉල්ලුම් පත් කැඳවනු ලැබේ.

1. වයස් සීමාව.—1975. 03. 31 වැනි දිනට ඉල්ලුම්කරුවන් ස්ත්‍රී පුරුෂ දෙපක්ෂයම වයස අවුරුදු 21 ට වැඩි සහ අවුරුදු 45 ට අඩු ශ්‍රී ලංකාවාසීන් විය යුතුය.

2. අධ්‍යාපන හා වෙනත් සුදුසුකම්.—(i) ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන්/අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයෙන් සිංහල/දෙමළ භාෂාව සහ අංක ගණිතය/ශුද්ධ ගණිතය වාණිජ අංක ගණිතය/උසස් ගණිතය/ව්‍යා. ගණිතය/ගණකාධිකරණය ඇතුළුව යටත් පිරිසෙයින් විෂයයන් තුනකින් ලබාගත් සාමාර්ථය ලබා සිටිය යුතුය.

(ii) පදිංචි පිළිබඳ සුදුසුකම්.—ඉල්ලුම්කරුවන් අවුරුදු 10 ක් හෝ ඊට වැඩි කාලයක සිට දෙහිවල ගල්කිස්ස මහ නගර සභා ප්‍රදේශය තුල ස්ථිර පදිංචිකරුවන් විය යුතුය. උප තැපැල් කාර්යාලය පිහිටි නාගරික කොට්ඨාශය තුල හෝ ඊට ඉතාමත් නුදුරු කොට්ඨාශය තුල හෝ පදිංචි කරුවනට අනුග්‍රහයක් දක්වනු ලැබේ.

(iii) කාර්යාල ඉඩකඩ.—අත්තිඩිය උප තැපැල් කාර්යාලය පවත්වාගෙන යාමට සුදුසු ගොඩනැගිල්ලක් දැනට මෙම කාර්යාලය පිහිටි ස්ථානයට ආසන්නවම ඉල්ලුම්කරුවන් විසින් ඉදිරිපත් කල යුතුය.

3. වැටුප්—අඩුම මාසික ඒකාබද්ධ වැටුප රු. 233 කි. මේ සීමාව ඉක්මවා දීමනා ගෙවන්නේ නම් ඒවා ගෙවනු ලබන්නේ එම කාර්යාලයේ කෙරෙන වැඩ ප්‍රමාණය අනුවය. ජීවනාධාර හා විශේෂ ජීවනාධාර ගෙවනු නොලබන අතර, එම ගෙවීමද ඒකාබද්ධ වැටුපට ඇතුලත් වේ. ස්ථිර සේවයේ සිටින උප තැපැල් ස්ථානාධිපතීන්ට නිවාඩු දීමනා සඳහා හිමිකම් ලැබේ. (සියලු දීමනා සහිත රු. 250 හෝ ඊට අඩු මාසික වැටුප් ලබන උප තැපැල් ස්ථානාධිපතීන්ට රු. 7.50 ක විශේෂ දීමනාවක්ද ගෙවනු ලැබේ.)

4. අයදුම් පත්.—කොළඹ 1, ඇවිලන් චතුරශ්‍රයේ අංක 5 දරණ ගොඩනැගිල්ලේ පිහිටි (කොළඹ දකුණ) කොට්ඨාශයේ ප්‍රදේශීය තැපැල් අධිකාරි කාර්යාලයෙන් ඉල්ලුම් පත් සඳහා මුද්‍රිත ආකෘති පත්‍ර ලබාගෙන, සම්පූර්ණ කරන ලද ඉල්ලුම් පත් 1975. 04. 30 දින හෝ ඊට ප්‍රථම ඔහු වෙත ලැබෙන්න සැලැස්විය යුතුය.

මේ සඳහා වැඩිදුරටත් විස්තරද (කොළඹ දකුණ) ප්‍රාදේශීය තැපැල් අධිකාරි තැනගෙන් ලබාගත හැකිය.

ඒ. ආර්. ඇම්. ජයවර්ධන,
පෝස්ට්මාස්ටර් ජනරාල් සහ විදුලි සංදේශ අධ්‍යක්ෂ.

4-6—75.04.04 දින අංක 158 දරණ ගැසට් පත්‍රය

---

**කළුතර දිස්ත්‍රික්කයේ කළුතර තොටමුණ උතුර ප්‍රා. ආ. නි. කොට්ඨාශයේ කළුතර බද්ද ගම්සභා ප්‍රදේශයේ හදිසි මරණ පරීක්ෂක ධුරය**

කළුතර දිස්ත්‍රික්කයේ, කළුතර තොටමුණ උතුර ප්‍රා. ආ. නි. කොට්ඨාශයේ මහවස්කඩුව, දෙදියවල, උග්ගල්බඩ, එතනමඩල, පලාතොට, මහහීනටියන්ගල, නාගොඩ (කොටසක්) කලමුල්ල සහ ඇතගම යන ග්‍රාමසේවක කොට්ඨාශ ඇතලත් කළුතර බද්ද ගම් සභා ප්‍රදේශයේ හදිසි මරණ පරීක්ෂක ධුරය සඳහා පහත සඳහන් සුදුසුකම් ඇති අපේක්ෂකයන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. පහත දැක්වෙන ආදර්ශ අයදුම් පත්‍රයේ අන්දමට පිළියෙල කරන ලද අයදුම්පත් 1975 මැයි මස 5 වෙනි දිනට හෝ ඊට පෙර දිසාපති, කච්චේරිය, කළුතර යන ලිපිනයට ලැබෙන සේ එවිය යුතුය.

2. මෙම තනතුර සඳහා වැටුපක් ගෙවනු නොලැබේ. එක් එක් හදිසි මරණ පරීක්ෂණයක් වෙනුවෙන් රු. 10 දීමනාවක් බැගින් ගෙවනු ලැබේ.

3. සුදුසුකම්.— පහත සඳහන් සුදුසුකම් තිබෙන බවට සැහෙන සාක්ෂි ඉදිරිපත් කළ යුතුය.—

(අ) ඉල්ලුම්පත් භාර ගන්නා දිනට වයස අවුරුදු 30 ට නොඅඩු හා 55 ට නොවැඩි වීම.

(ආ) විශිෂ්ඨ චරිතයකින් හා මනා සෞඛ්‍ය තත්වයෙන් යුක්ත වීම.

(ඇ) ඉල්ලුම්කරු ප්‍රදේශයේ ස්ථිර පදිංචිකරුවකු වීම.

(ඈ) යටත් පිරිසෙයින් ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගය සිංහල හෝ දෙමළ සහ අංක ගණිතය හෝ මූලික ගණිතය සමග හෝ අ.පො.ස, (සා,පෙ,) විභාගය විෂයයන් හයකින් (වාර 2 නොවැඩි) සිංහල හෝ දෙමළ සහ අංක ගණිතය හෝ මූලික ගණිතය සමග සමත් වී සිටීම.

(ඉ) මාසික ආදායම රු. 200 හෝ එයට වැඩි විය යුතුය.

4. අයදුම්කරුවන් ඔවුන්ගේ අයදුම් පත් සමඟ පහත සඳහන් සහතික වල පිටපත් අමුණා එවිය යුතුය :—

(අ) උප්පැන්න සහතිකය.

(ආ) ලබා ඇති උසස්ම අධ්‍යාපන සුදුසුකම් පිළිබඳ සහතික.

(ඇ) චරිතය පිළිබඳ මෑතදී ලබාගත් සහතික දෙකක්.

(ඉ) කොට්ඨාශයේ පදිංචිය ගැන ග්‍රා. සේ. සහතිකයක්.

(ඊ) ආදායම පිළිබඳව ග්‍රා. සේ. සහතිකයක්.

5. රජයේ සංස්ථා හා පළාත් පාලන සේවකයින්ද පළාත් පාලන ආයතන වල නියෝජිතයින්ද මෙම තනතුර සඳහා ඉල්ලුම්පත් එවීමට නුසුදුස්සෝ වෙති. ඔවුන්ගේ ඉල්ලුම් පත් භාර ගනු නො ලැබේ.

6. ඉල්ලුම්පත් ලැබුණු බවට දැන්වීමක් කරනු නොලැබේ. අයදුම් පත් ලේඛනගත තැපෑලෙන් එවිය යුතුය.

පී. ජී. පුංචිහේවා,
කළුතර දිස්ත්‍රික්කයේ දිසාපති.

1974 මාර්තු 21 වැනි දින,
කළුතර දිසාපති කාර්යාලයේදීය.

ආදර්ශ අයදුම් පත්‍රය

කළුතර දිස්ත්‍රික්කයේ කළුතර තොටමුණ උතුර ග්‍රා. ආ. නි. කොට්ඨාශයට අයත් වන කළුතර බද්ද ගම්සභා ප්‍රදේශයේ හදිසි මරණ පරීක්ෂක ධුරය

1. අයදුම්කරුගේ සම්පූර්ණ නම (පෙළපත් නාමය සමඟ) පැහැදිලි අකුරෙන් :————.
2. ලිපිනය :————.
3. ස්ථිර පදිංචි ස්ථානය හා එහි පදිංචි කාලය :————.
4. (අ) අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට සම්පූර්ණ වයස :—
   (ආ) උපන් දිනය සහ ස්ථානය :————.
5. විවාහක අවිවාහක බව :————.
6. අධ්‍යාපන සුදුසුකම් :————.
7. දැනට කරන රක්ෂාව :————.
8. මීට පෙර රැකියාවක් කෙළේද? එසේ නම් ඒ පිළිබඳ විස්තර :————.
9. තමන් සතු දේපොලවල වටිනාකම සහ ප්‍රමාණයන් විස්තර සහිතව :————.
10. ඉල්ලුම්කරු ණය ගැතිව සිටීද? එසේ නම් ඒ පිළිබඳ විස්තර : ————.
11. ඉල්ලුම්කරු කිසියම් චෝදනාවකට වරදකරු වී අධිකරණයක් මඟින් දඬුවම් ලබා තිබේද? එසේ නම් ඒ පිළිබඳ විස්තර : ————.
12. මෙම තනතුර සඳහා වෙනත් සුදුසුකම් ඇතොත් ඒ පිළිබඳ විස්තර :————.

————,
ඉල්ලුම්කරුගේ අත්සන.

දිනය :————.

4–16—75.04.04 දින අංක 158 දරණ ගැසට් පත්‍රය

---

දූනකරි ග්‍රා. ආ. නි. කොට්ඨාශයේ පල්ලවරායන්කට්ටු ගම් සභා ප්‍රදේශයේ හදිසි මරණ පරීක්ෂක වරයෙක් පත් කිරීම

යාපනය දිස්ත්‍රික්කයේ ඉහත සඳහන් කොට්ඨාශයේ හදිසි මරණ පරීක්ෂක ධුරය සඳහා සුදුසුකම් ඇති අපේක්ෂකයින්ට අයදුම් පත් ඉදිරිපත් කරන ලෙස ඉල්ලා සිටිමි.

පහත දක්වා ඇති ආකෘති පත්‍රයේ අන්දමට සකස් කරන ලද අයදුම්පත් 1975. 4. 30 දිනට පෙර පහත සඳහන් ලිපිනයට ලියා පදිංචි තැපෑලෙන් එවිය යුතුය :—
දිසාපති, කච්චේරිය, යාපනය.

2. පහත සඳහන් සුදුසුකම් තිබෙන බවට සෑහෙන සාක්ෂි ඉදිරිපත් කළ යුතුය :—

(අ) ඉල්ලුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු 30 කට නොඅඩු හා 55 කට නොවැඩි වීම.

(ආ) ඉහත කී කොට්ඨාශයේ ස්ථිර පදිංචි කරුවකු වීම.

(ඇ) මනා චරිතයකින් යුක්තවීම.

(ඈ) දෙමළ භාෂාව සමග ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාග යෙන් හෝ අ. පො. ස. සාමාන්‍ය පෙළ විභාගයෙන් දෙවාරයකට නොවැඩි වාර ගණනකදී සිංහල/දෙමළ සහ අංක ගණිතය /මූලික ගණිතය සමග විෂයයන් 6 කින් සාමාර්ථ යක් ලබා තිබිය යුතුය.

(ඉ) මාසික ආදායම රු. 200 ක් හෝ ඊට වැඩි විය යුතුය.

3. අයදුම්කරුවන් විසින් ඔවුන්ගේ අයදුම්පත් සමග පහත සඳහන් සහතිකවල පිටපත් අමුණා එවිය යුතුය :—

(අ) උප්පැන්න සහතිකය.

(ආ) අධ්‍යාපන සුදුසුකම් පිළිබඳ සහතිකය.

(ඇ) චරිතය පිළිබඳ මෑතකදී ලබාගත් සහතික දෙකක්, එකක් කොට්ඨාශයේ ග්‍රාමසේවකගෙන් විය යුතුය.

4. රජයේ සංස්ථාවල හා පළාත් පාලන ආයතනවල සේවකයින්ගේද, පළාත් පාලන ආයතනවල නියෝජිතයින්ගේද අයදුම්පත් භාරගනු නොලැබේ.

එම්. ටී. ඩබ්ලිව්. අමරසේකර,
යාපනය දිසාපති.

1975. 3. 19 දින,
යාපනය දිසාපති කාර්යාලයේදීය.

ආදර්ශ අයදුම් පත්‍රය

යාපනය දිස්ත්‍රික්කයේ .............................. කොට්ඨාශයේ හදිසි මරණ පරීක්ෂක ධුරය

1. සම්පූර්ණ නම සහ ලිපිනය————.
2. පදිංචි ස්ථානය————.
3. වයස සහ උපන් දිනය————.
4. විවාහක අවිවාහක බව————.
5. අධ්‍යාපන සුදුසුකම්————.
6. දැනට දරණ හෝ කලින් දැරූ තනතුරු————.
7. මාසික ආදායම් රු.————.

————,
ඉල්ලුම්කරුගේ අත්සන,

දිනය :————,

4–3—75.04.04 දින අංක 158 දරණ ගැසට් පත්‍රය

---

පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව

වැඩ කළමනාකාර තනතුර

පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුවේ වැඩ කළමනාකාර තනතුර සඳහා අයදුම් පත් කැඳවනු ලැබේ.

2. අයදුම්පත්‍ර.—මෙහි පහත සඳහන් ආදර්ශ ආකෘති පත්‍රය අනුව තම අත්අකුරින්ම දුරවා කොමසාරිස්, පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව, තැ. පෙ. 546, කොළඹ 1 යන ලිපිනයට (පෞද්ගලික ලිපිනයට නොව) 1975. 04. 30 වැනි දිනට හෝ ඊට පෙර ලැබෙන ලෙස ලියාපදිංචි කළ තැපෑලෙන් එවිය යුතුය.

සැ. යු.—අයදුම්පත් එවන කවරයේ වම් උඩ කෙළවරේ "වැඩ කළමනාකාර තනතුර" සඳහා අයදුම්පත් යන්න සඳහන් කළ යුතුය.

3. වැටුප.—මෙම තනතුරට අයත් වනුයේ රු. 6,024න් පටන්ගෙන වර්ෂයට රු. 144 බැගින් වූ වාර්ෂික වැටුප් වැඩිවීම් 4කින් හා වර්ෂයට රු. 180ක් බැගින් වූ වාර්ෂික වැටුප් වැඩිවීම් 8කින් වර්ෂයට රු. 8,040 තෙක් තයිත වැටුප් ක්‍රමයකි.

රු. 6,780 සහ රු. 7,500 වැටුප් පියවර වලට පෙර කාර්යක්ෂමතා කඩඉම් ඇත.

4. පත්වීම් පිළිබඳ කොන්දේසි සහ සේවා කොන්දේසි:

(අ) මේ තනතුර ස්ථිරය, විශ්‍රාම වැටුප් රහිතය. තෝරාගන්නා තැනැත්තා විසින් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට දායක මුදල් ගෙවිය යුතුය.

සටහන: 1971. 12. 31 දිනට පෙර විශ්‍රාම වැටුප් සහිත රජයේ ස්ථිර තනතුරක් දැරුවකු මෙම තනතුරට තෝරා ගනු ලැබුවහොත් ඔහු තවදුරටත් විශ්‍රාම වැටුප් තත්වය භුක්ති විඳිනු ඇත.

(ආ) අවුරුදු 3ක ආධුනික කාලයකට යටත් වේ.

(ඇ) දැනටමත් රජයේ සේවයේ නියුතු ස්ථිර නිලධාරියකු තෝරාගනු ලැබුවහොත් වැඩ බැලීමේ කාලයකට යටත් වේ

(ඈ) දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට සූදානම් විය යුතුය.

5. අවශ්‍ය සුදුසුකම්.—සෑම අයදුම්කරුවෙක්ම පහත සඳහන් කරුණු සඳහා පිළිගත හැකි සාක්ෂි ඉදිරිපත් කළ යුතුය:—

(i) ලාංකිකයෙක් බවට.

(ii) 1975. 04. 30 දිනට වයස අවුරුදු 25ට නොඅඩු හා 45ට නොවැඩි විය යුතුය. (රජයේ සේවයේ දැනට නියුක්තව සිටින්නන්ට මෙම උපරිම වයස් සීමාව බලපාන්නේ නැත)

(iii) ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගය හෝ සිංහල/දෙමළ භාෂාව සහ ගණිතය/අංක ගණිතය ඇතුළුව විෂයයන් හය කින් දෙකකට නොවැඩි වාර ගණනකදී ලබාගන්නා ලද අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) සහ එයට අමතරව පහත සඳහන් සහතිකපත් වලින් එකක් ලබා තිබිය යුතුය:—

(අ) ලංකා කාර්මික විද්‍යාලයේ කණිෂ්ඨ කාර්මික නිලධාරීන්ගේ සහතිකය. (යාන්ත්‍රික හා විදුලි කාර්මික) හෝ

(ආ) අම්පාරේ හෑඩි කර්මාන්ත ආයතනයේ ඩිප්ලෝමා සහතිකය හෝ

(ඇ) ලංකා කාර්මික විද්‍යාලයේ සන්ධ්‍යා යාන්ත්‍රික ඉංජිනේරු සහතිකය හෝ

(ඈ) ජාතික තාක්ෂණික ඩිප්ලෝමාව හෝ

(ඉ) සමාන සුදුසුකම් සහ

(iv) පිළිගත් ආයතනයක කාර්මික වැඩ සම්බන්ධයෙන් යටත් පිරිසෙයින් 5 අවුරුදු පළපුරුද්දක් තිබිය යුතුය.

සටහන: ගොඩනැගිලි තැනීම සම්බන්ධයෙන් ප්‍රායෝගික අත්දැකීමක් ඇති අයට වැඩි සැලකිල්ලක් දක්වනු ලැබේ.

(v) විශිෂ්ඨ චරිතයකින් හා මනා ශාරීරික සෞඛ්‍යයෙන් යුක්ත විය යුතුය.

(vi) සමාජ සුභසාධනය පිළිබඳ ශාස්ත්‍රීය සුදුසුකම් හෝ පළපුරුද්දෙන් ලත් අත්දැකීම් ඇති අයදුම්කරුවන් පිළිබඳ විශේෂ සැලකිල්ලක් දක්වනු ලැබේ.

6. අයදුම්කරුවකු විසින් තම අයදුම්පත්‍ර වලට පහත සඳහන් සහතිකවල පිටපත් පමණක් ඇමිණිය යුතුය:—

(අ) උප්පැන්න සහතිකය. (බෞතීස්ම සහතික පත්‍ර හෝ අධ්‍යයන ව්‍යවස්ථා සංග්‍රහය යටතේ නිකුත් කරන ලද සහතික පත්‍ර භාරගනු නොලැබේ.)

(ආ) ලබා ඇති උසස්ම අධ්‍යාපන සහතිකය.

(ඇ) ඉහත 5 වන පරිච්ඡේදයේ 3 වන උප ඡේදයේ (අ), (ආ) හා (ඇ) (ඈ) යටතේ සුදුසුකම් ලබා ඇති සහතිකය.

(ඈ) කාර්මික පළපුරුද්ද පිළිබඳ සහතිකය.

(ඉ) චරිතය පිළිබඳ මෑතකදී ලබාගත් සහතික 3ක්.

7. නියමිත දිනට පසුව ලැබෙන ඉල්ලුම් පත්‍ර භාරගනු නොලැබේ. 5 වන පරිච්ඡේදයේ සඳහන් සුදුසුකම් ලත් දැනට රාජ්‍ය සේවයේ සිටින අයදුම්කරුවන්ගේ අයදුම්පත්‍ර ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානීන් මගින් එවිය යුතුය. එවැනි ඉල්ලුම්පත්‍ර නියමිත දිනට පසුව මෙම දෙපාර්තමේන්තුවට ලැබුණහොත් ඒ ඉල්ලුම්පත්‍ර ඒ ඒ අයදුම්කරුවන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානීන් වෙත නියමිත දිනට කලින් ලැබුණ බව සඳහන් කර එම ඉල්ලුම්පත්‍ර ප්‍රමාදවීමට හැරෙන හේතු දක්වමින් ඉල්ලුම්පත්‍ර භාරගන්නා ලෙස නිර්දේශයක් කළහොත් පමණක් එසේ ප්‍රමාදවී ලැබෙන ඉල්ලුම්පත් භාරගනු ලැබේ.

8. ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ I වන කොටසේ (II අ) ඡේදයේ මුල පළකර තිබෙන රාජ්‍ය සේවාවේ තනතුරුවලට පත්වීම් සම්බන්ධ පොදු කොන්දේසි බලනු මැනවි,

9. මේ නිවේදනයට අනුකූල නොවන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම්පත් ලැබුණු බව දන්වනු නොලැබේ.

එන්. කේ. ඒ. ද සිල්වා,
පරිවාස හා ළමාරක්ෂක සේවා කොමසාරිස්.

1975. 03. 19 දින,
තැ. පෙ. 546, කොළඹ 1,
පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුවේදීය.

ආදර්ශ ආකෘති පත්‍රය

පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුවේ වැඩ කළමනාකාර තනතුර සඳහා අයදුම්පත්‍රය

1. සම්පූර්ණ නම :———.

2. ස්ථිර ලිපිනය :———.

3. වයස, උපන් දිනය (උප්පැන්න සහතිකයේ පිටපත් අමුණන්න) :———.

4. විවාහකද අවිවාහකද යන බව :———.

5. අධ්‍යාපනික සුදුසුකම් (සහතික පිටපත් ඇමිණිය යුතුය) : ———.

6. කාර්මික සුදුසුකම් (සහතික පිටපත් ඇමිණිය යුතුය) :———.

7. ළමා සුභසාධක වැඩ පිළිබඳ ලබා ඇති සුදුසුකම් හා අනිකුත් සමාජසේවා වැඩ සහ පළපුරුදුකම් :———.

8. ලබා ඇති පුහුණුවීම්, සුදුසුකම් හෝ පළපුරුදුකම් පිළිබඳ විශේෂ සුදුසුකම් :———.

9. පාඨශාලාවෙන් අස්වීමෙන් පසු කරන ලද රැකියාවන් (කවුරුන් යටතේ ද, කුමන රැකියාවක් ද, කොපමණ කාලයක් ද, යනු සඳහන් කළ යුතුයි. අයදුම්කරු රජයේ සේවයේ නියුක්තව සිටියෙහිද ? හෝ සිටිත් ද එසේ නම් ඔහු කළ රාජකාරි ගැන විස්තරයක් ද සඳහන් කළ යුතුය) :———.

10. දැනට කරන රැකියාව :———.

11. රජයේ දෙපාර්තමේන්තුවක හෝ රාජ්‍ය අංශයේ මණ්ඩලයක සංස්ථාවක (මධ්‍යම බැංකුව, ජනසතු කළ බැංකු, වාණිජ බැංකු, විශ්ව විද්‍යාල, රජය මගින් පාලනය කරනු ලබන හවුල් ව්‍යාපාර, සමාගම් යනාදිය) සේවය කර ඇත්නම් එම සේවය අවසන් කිරීමට හේතු :———.

12. අමුණා ඇති චරිත සහතික ලබාගත් පුද්ගලයින්ගේ නම සහ ලිපිනයන් :———.

මෙම අයදුම්පතෙහි මා විසින් දක්වා ඇති කරුණු සත්‍ය මුත්, නිවැරදිවූත් ඒවා බවට සහතික කරමි.

———,
අයදුම්කරුගේ අත්සන.

දිනය :———.

ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ සේරුවිල කොට්ඨාශයේ, උප්පැන්න හා මරණ සහ කොඩ්ඩියාර් පත්තු කොට්ඨාශයේ විවාහ (සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් ධුරය

'සේරුවිල' උප්පැන්න හා මරණ ලියා පදිංචි කිරීමේ කොට්ඨාශය තුල සවිර පදිංචියක් ඇත්තාවූ හෝ, එහි පදිංචි වී කොට්ඨාශය තුළ සැහෙන දේපලක් හිමිව සිටින ගම්වාසීන්ගේ සැලකුම්ද ලබන. ඉල්ලුම්පත් භාරගන්නා අවසාන දිනට වයස අවුරුදු විසිඑකට නො අඩු ස්ත්‍රී පුරුෂ දෙපක්ෂයෙන්ම ඉහත සඳහන් ධුරය සඳහා ඉල්ලුම් පත් කැඳවනු ලැබේ. රජයේ ස්ථිර සේවයේ නියුතු අයදුම්කරුවන් සඳහා මෙම වයස් සීමාව අදාල නොවේ.

2. මෙම ධුරය සඳහා ඉදිරිපත්වන අයට තිබිය යුතු අධ්‍යාපනික හා අනෙකුත් සුදුසුකම් ආදිය පිළිබඳ සියලු විස්තර මෙම කාර්යාලයේ සහ ප්‍රාදේශීය ආදායම් පාලක නිලධාරි කාර්යාලය, ග්‍රාමසේවක කාර්යාලය, පලාත් පාලන ආයතන කාර්යාල, ග්‍රාමීය උසාවි, තැපැල් කාර්යාල, පොලිස් ස්ථාන සහ ප්‍රජාමණ්ඩල, ප්‍රසිද්ධ වෙළඳ පොලවල් සහ සමූපකාර සමිති ආදී කොට්ඨාශයේ ප්‍රසිද්ධ ස්ථාන සහ කාර්යාල වල ප්‍රදර්ශණය කර ඇති දැන්වීම් වල ඇතුලත් වේ.

3. සියලුම ඉල්ලුම් පත් මෙම කාර්යාලයෙන් ලබාගත හැකි ආකෘති පත්‍රවල සකස් විය යුතු අතර, ඒවා 1975 අප්‍රේල් මස 21 දිනට හෝ ඊට පෙර මා වෙත ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

තිස්ස දේවේන්ද්‍ර,
දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්.

1975 මාර්තු මස 10 දින,
ත්‍රිකුණාමලයේ දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ දී ය.

4-25—75.04.04 දින අංක 158 දරණ ගැසට් පත්‍රය

---

මහා භාණ්ඩාගාරය

පුස්තකාලයාධිපති තනතුර

මහා භාණ්ඩාගාරයේ පුස්තකාලයාධිපති තනතුර සඳහා මෙයින් අයදුම් පත් කැඳවනු ලැබේ. මෙම නිවේදනයට යාකොට ඇති ආකෘති පත්‍රයේ ප්‍රකාර පිළියෙළ කළයුතු වන අයදුම් පත් 1975 අප්‍රේල් මස 18 වැනි දිනට හෝ ඊට පෙර භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම් (මධ්‍යම ශාඛාව) තැ. පෙ. 500, කොළඹ 1 යන ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපැලෙන් එවිය යුතු ය. අයදුම් පත් බහා එවන ලියුම් කවරයේ වම්පස ඉහළ කෙළවරෙහි "පුස්තකාලයාධිපති තනතුර" යන්න පැහැදිලි ලෙස සඳහන් කළ යුතුය.

සටහන.—ඉල්ලුම් පත්‍ර තැපැලේ දී නැති වූ බවට හෝ ප්‍රමාද වූ බවට කෙරෙන පැමිණිලි ගැන සලකා බැලීමට නොපිළිවන. අවසාන දිනය දක්වා ඉල්ලුම් පත්‍ර ප්‍රමාද කිරීමෙන් සිදුවිය හැකි අලාභහානි අයදුම්කරුවන් විසින්ම විඳ දරා ගනු ලැබිය යුතුය.

2. වැටුප් හා දීමනා.—ස්ථිර විශ්‍රාම වැටුප් රහිත පදනමක් පිට විවාහක දීමනාව ද සමඟ වර්ෂයකට රුපියල් 6,600—8×180—8,040 ඒකාබද්ධ වැටුපක්.

3. අවශ්‍ය සුදුසුකම්.—සෑම අයදුම්කරුවකු විසින්ම—

(අ) ඔහු/ඇය විශිෂ්ට චරිතයෙන් හා මනා ශාරීරික සෞඛ්‍යයෙන් යුක්තව සිටින බවට ද,

(ආ) 1975 අප්‍රේල් 18 වැනි දිනට වයස අවුරුදු 21 ට නො අඩු හා වයස අවුරුදු 35 ට නොවැඩි බවට ද සතුටුදායක සාක්ෂි ඉදිරිපත් කර සිටිනු ලැබිය යුතු ය.

(දැනටමත් රජයේ සේවයෙහි නියුක්තව සිටින අයදුම් කරුවන්ට උපරිම වයස් සීමාව බල නොපානු ඇත.)

(ඇ) අධ්‍යාපන සුදුසුකම්.— (i) ලංකා පුස්තකාල සංගමයේ මධ්‍ය පරීක්ෂණය, හෝ කණිෂ්ඨ විශ්ව විද්‍යාලයක පුස්තකාල විද්‍යා ඩිප්ලෝමා සහතිකය හෝ සමාන සුදුසුකම්, හෝ

(ii) ලංකා පුස්තකාල සංගමයේ ප්‍රථම පරීක්ෂණය සමඟ රජයේ/සංස්ථාවක/වෙනත් පිළිගත් ආයතනයක පුස්තකාලයාධිපති වරයෙකු හෝ සහකාර පුස්තකාලයාධිපති වරයෙකු වශයෙන් අවුරුදු 10ක කාලයක පළපුරුද්දක් තිබිය යුතුය.

4. පහත සඳහන් ලියකියවිලි වලින් එකක් හෝ සියල්ලම, ඉල්ලා සිටි විටක ඉදිරිපත් කිරීමට අයදුම්කරුවන් සූදානමින් සිටිය යුතුය :—

(අ) උප්පැන්න සහතිකය (අධ්‍යාපන රෙගුලාසි සංග්‍රහයේ ප්‍රකාර උපකෘත පාඨශාලාවල ප්‍රයෝජනය සඳහා නිකුත් කරනු ලබන උප්පැන්න සහතික හෝ බෞතීස්ම සහතික භාරගනු නොලැබේ).

(ආ) උසස්ම අධ්‍යාපන සහතිකය,

(ඇ) වෘත්තීය හා/හෝ කාර්මික සුදුසුකම් පිළිබඳ සහතික,

(ඈ) සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂාවලින් සමත් උසස් විභාග පිළිබඳ සහතික.

සටහන.—(i) ඉල්ලුම් පත්‍රයට කිසිම ලියවිල්ලක් හෝ එහි පිටපතක් හෝ ඇමිණිය යුතු නැත.

(ii) ඉල්ලා සිටි විටෙක ලියකියවිලි ඉදිරිපත් කිරීමට නොහැකි වන අයදුම් කරුවන්ගේ ඉල්ලුම් පත්‍ර ගැන සලකා බලනු නොලැබේ.

5. රාජ්‍ය සේවයේ නියුක්තව සිටින නිලධාරීන් විසින් තම තමන්ගේ ඉල්ලුම් පත්‍ර තම තමන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් ඉදිරිපත් කර සිටිනු ලැබිය යුතුය.

6. ඉල්ලුම් පත්‍ර හා ඒ හා සම්බන්ධ අනෙකුත් ඕනෑම ලියවිල්ලක් මහා භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම් වෙත මිස මෙම කාර්යාලයේ කිසියම් නිලධාරියකුගේ නමට පෞද්ගලිකව නො එවිය යුතු ය.

7. ගැසට් පත්‍රයේ I වැනි කොටසේ (IIඅ) වැනි ඡෙදයේ ආරම්භයෙහි සඳහන් රාජ්‍ය සේවයේ තනතුරු සඳහා කෙරෙන පත්වීම් සම්බන්ධයෙන් බලපාන පොදු කොන්දේසිවලට අවධානය යොමු කරනු ලැබේ.

එල්. බී. අබේරත්න,
භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම්.

1975 අප්‍රේල් මස 25 වැනි දින,
මහා භාණ්ඩාගාරය,
තැ. පෙ. 500,
ගාලු මුවදෙර මහලේකම් කාර්යාලය,
කොළඹ.

ඉල්ලුම් පත්‍ර ආකෘතිය

1. ඉල්ලුම් කරන තනතුර :————.

2. සම්පූර්ණ නම (පැහැදිලි අකුරින්) :————.

3. තැපැල් ලිපිනය (ලිපිනයෙහි වෙනසක් වුවහොත් දැනුම් දිය යුතුය) :——

4. උපන් දිනය : වර්ෂය :————. මාසය :————. දිනය :——.

5. ඉල්ලුම් පත්‍ර බාරගන්නා අවසාන දිනය වන විට නියම වයස :————.
වර්ෂ :————. මාස :————. දින :————.

6. ඔබ ලංකා පුරවැසියෙක්ද ,පාරම්පරික රටවැසියෙක්ද එසේ නැත හොත් ලියාපදිංචි වූ රටවැසියෙක්ද යන බව සඳහන් කරන්න :——.

7. උපන් ස්ථානය :
(අ) ඉල්ලුම්කරුගේ :————.
(ආ) පියාගේ :————.
(ඇ) පිය පාර්ශ්වයේ මුත්තාගේ :————.
(ඈ) පිය පාර්ශ්වයේ මී මුත්තාගේ :————.

8. (අ) ස්ත්‍රී පුරුෂ භාවය :————.
(ආ) ඔබ විවාහක ද, අවිවාහක ද, වැන්දඹුවෙක් ද, වැන්දඹුවක ද යන බව :————.

9. සාමාර්ථය ලබා ඇති ඉහළම විභාගය :—
(1) සිංහල :————.
(2) දෙමළ :————.
(3) ඉංග්‍රීසි :————.

10. අධ්‍යාපන, වෘත්තීය සහ/හෝ කාර්මික සුදුසුකම් (ලබා ගන්නා ලද සියලුම උපාධි, විශිෂ්ඨ සාමාර්ථ, වෘත්තීය හා කාර්මික සුදුසුකම්වල විස්තර, ඒවායේ දින, පංතියක් වේ නම් එය, ඒවා සඳහා ගන්නා ලද විෂයයන් සහ ඒවා ලබා ගත් ආයතනවල නම් සඳහන් කරන්න :——.

11. දැනට නිරත රක්ෂාව සහ ඊට ප්‍රථමයෙන් කරන ලද රක්ෂාවල් (රක්ෂාවලට බැඳුනු දිනය, ඉන් අස් වූ දිනය හා අන්තිමට ලැබූ වාර්ෂික වේතනය සඳහන් කරන්න) :————.

| පදවිය | සිට | දක්වා | වාර්ෂික වැටුප රුපියල් |
|---|---|---|---|
| ............ | ............ | ............ | ............ |
| ............ | ............ | ............ | ............ |
| ............ | ............ | ............ | ............ |
| ............ | ............ | ............ | ............ |
| ............ | ............ | ............ | ............ |
| ............ | ............ | ............ | ............ |
| ............ | ............ | ............ | ............ |

සැලකිය යුතුයි.—ආණ්ඩුව යටතේ කළ සේවය අවසන් වීමට හේතුව මෙහි පහළ 13 කොටුවෙහි සඳහන් කළ යුතුය.

12. විශේෂ සුදුසුකම්:—(දන්වීමෙහි දක්වෙන විශේෂ සුදුසුකම් සහ/හෝ පළපුරුද්ද ඔබට ඇත්තේ ද? එසේ ඇතොත් දිනයන් ද ඇතුළුව ඒ පිළිබඳ සම්පූර්ණ විස්තර සඳහන් කරන්න. විශේෂ සුදුසුකම් කිසිවක් නියම කොට ඇත්දැයි ගැසට් නිවේදනය බලන්න :————.

13. තවත් තොරතුරු කිසිවක් වේ නම් ඒවා :————.

මෙම ඉල්ලුම් පත්‍රයෙහි මවිසින් සපයන ලද තොරතුරු සත්‍යවූත් නිවැරදිවූත් ඒවා බව මෙයින් සහතික කරමි. මෙහි ඇතුළත් තොරතුරු වලින් කිසිවක් අසත්‍ය හෝ වැරදි බව මා තෝරා ගැනීමට පෙර දනගතහොත් මා නුසුදුස්සකු වීමට යටත් බවත්, පත් කිරීමෙන් පසුව ඒ බව දනගතහොත් මට කිසිදු වන්දියක් නොගෙවා සේවයෙන් පහ කිරීමට යටත් බවත් මම දන සිටිමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

4-71—1975.04.04 දින අංක 158 දරණ ගැසට් පත්‍රය.

---

## ශ්‍රී ලංකා නාවික හමුදාවේ නැව් කාර්මික ශිල්පි (සිවිල්) තනතුරු සඳහා ඇබෑර්තු

ශ්‍රී ලංකා නාවික හමුදාවේ නිත්‍ය බලකායේ නැ.කා.ශි. (සිවිල්) තනතුරු සඳහා ඉදිකිරීම්/තැනීම් සම්බන්ධ පළපුරුදුකම් ඇති අයගෙන් ඉල්ලුම්පත් කැඳවනු ලැබේ. අපේක්ෂකයන්ට නියමිත සුදුසුකම් තිබිය යුතු අතර පහත සඳහන් කොන්දේසි ද, සපුරාලිය යුතුය.

2. සෑම අපේක්ෂකයෙකුම පහත විස්තර කර ඇති සියලුම කොන්දේසි සපුරාලිය යුතුය.

(අ) ශ්‍රී ලංකාවේ පුරවැසියෙක් වීම,

(ආ) සිංහල භාෂාව/හෝ දෙමළ භාෂාව සහිතව ලංකා අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයෙන් දෙවරකට නො වැඩි වාර ගණනකදී විෂයයන් හයකින් සමත්ව තිබීම සහ පහත සඳහන් විෂයයන්ගෙන් සම්මාන දෙකකට නොඅඩුව තිබීම.

| | |
|---|---|
| (i) ශුද්ධ ගණිතය | (iv) ව්‍යවහාරික ගණිතය |
| (ii) භෞතික විද්‍යාව | (v) රසායන විද්‍යාව |
| (iii) උසස් ගණිතය | (vi) ජ්‍යාමිතික/යාන්ත්‍රික ඇඳීම. |

(ඇ) පහත සඳහන් කාර්මික සුදුසුකම් වලින් එකක් වත් තිබිය යුතුය :—

(i) ලංකා කාර්මික විද්‍යාලයේ කණිෂ්ඨ කාර්මික නිලධාරීන්ගේ (සිවිල්) පාඨමාලාව සාර්ථක ලෙස සම්පූර්ණ කර තිබීම (හෝ ඒ හා සමාන සුදුසුකම් ලබා තිබීම) සහ රජයේ කාර්මික දෙපාර්තමේන්තුවක/සංස්ථාවක අවුරුදු 3ක පළපුරුද්දක් තිබීම හෝ පිළිගත් පෞද්ගලික කොන්ත්‍රාත්කරුවකු සමග සිවිල් ඉංජිනේරු රාජකාරි කර තිබීම ;

(ii) ලංකා කාර්මික විද්‍යාලයක ගොඩනැගිලි ඉදිකිරීම/සැලසුම් ඉංජිනේරු/සමස්ථ ඉංජිනේරු සන්ධ්‍යා පාඨමාලාව සාර්ථක ලෙසින් සම්පූර්ණ කර තිබීම සහ අවුරුදු 4ක පාලක තත්ත්වයක ප්‍රායෝගික පළපුරුද්දක් තිබීම, හෝ

(iii) රජයේ ජ්‍යෙෂ්ඨ කාර්මික ආයතනයක කණිෂ්ඨ කාර්මික නිලධාරීන්ගේ (සිවිල්) ඩිප්ලෝමා පාඨමාලාව සාර්ථක ලෙසින් සම්පූර්ණ කොට තිබීම සහ රජයේ කාර්මික දෙපාර්තමේන්තුවක/සංස්ථාවක/මණ්ඩලයක හෝ පෞද්ගලික සමාගමක වගකිව යුතු තත්ත්වයක වැඩ පරිපාලනය කිරීම පිළිබඳ අවුරුදු 3ක පළපුරුද්දක් තිබීම ;

(iv) උප පරීක්ෂකවරුන් (සිවිල්) වශයෙන් උසස් කිරීම සඳහා විභාග දෙපාර්තමේන්තුව මගින් පවත්වනු ලබන කාර්මික නිලධාරීන්ගේ පරීක්ෂණයේ අඩු වශයෙන් පහත සඳහන් විෂයයන්ගෙන් පසකින් වත් සමත්ව තිබීම ;

ගොඩනැගිලි ඉදි කිරීම සහ නඩත්තුව ප්‍රමාණ ගැනීම හා ඇස්තමේන්තු කිරීම වාස්තු විද්‍යාත්මක හා සැලසුම් ඇඳීම මැනීම හා මට්ටම් කිරීම (න්‍යාය) මැනීම හා මට්ටම් කිරීම (ක්ෂේත්‍ර කටයුතු) ජල සම්පාදනය හා ජලාපවහනය පාලම් හා විශාල තැනීම් පාරවල් තැනීම හා නඩත්තුව ; සහ

යකඩ කම්බි යොද ශක්තිමත් ලෙස ගොඩනංවන සිමෙන්ති කොන්ක්‍රීට් වැඩ/යකඩ වැඩ තැනීම/ගොඩනැගිලි නඩත්තු වැඩ/පරිමාණ ලදපත් සැකසීම හා ඇස්තමේන්තු කිරීම/ඉදි කිරීම ස්ථාන වල කම්කරු වැඩ පරීක්ෂා කිරීම ආදී වැඩ පිළිබඳ අවුරුදු 3ක පළපුරුද්දක් තිබීම,

(ඈ) 1975 අප්‍රේල් මස 01 දිනට වයස අවුරුදු 20 ට නොඅඩු අවුරුදු 30 ට නොවැඩි විය යුතුය.

(ඉ) පහත සඳහන් අවම ශාරීරික අවශ්‍යතාවයන් තිබීම :

(i) උස : අඩි 5 අඟල් 4

(ii) බර : රාත්තල් 105

(iii) පපුවේ මිනුම : අඟල් 32 (පුළුල් නොකළ).

(ඊ) නාවික හමුදාපති සෑහීමට පත්වන වෛද්‍ය පරීක්ෂණයකට සමත් වීම.

3. තෝරා ගැනීමට ප්‍රථම අපේක්ෂකයන්ට පරීක්ෂණයකට පෙනී සිටීමට සිදුවනවා ඇත.

4. විශේෂඥ රාජකාරි වල නිරත කිරීමට ප්‍රථම අපේක්ෂකයන්ට සති 2–4 ක කාලයක පුහුණුවක් ලබා දෙනු ඇත.

5. තෝරා ගනු ලබන අපේක්ෂකයින් බඳවා ගනු ලබන දින වලංගුව පවතින (1950 දෙසැම්බර් 09 දින අංක 10,187 දරණ ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ පළකරනු ලැබූ) වරින්වර සංශෝධනය කරනු ලැබූ 1950 නාවියන් බඳවා ගැනීමේ හා සේවා රෙගුලාසි මත සේවා කොන්දේසි පාලනය වේ. දනට නිත්‍ය නාවික බලකායට බඳවා ගනු ලබන ඕනෑම නාවියකුගේ මුල් කාලසීමාව අවුරුදු 12 කි. නාවික හමුදපති විසින් අවුරුදු 20 කට වැඩි නොවන කාලයක් සඳහා නැවත සේවයට බැඳීමට ඔහුට ඉඩදෙනු ඇත. සාමාන්‍යයෙන් නැවියෙකුට අවුරුදු 22 ක සම්පූර්ණ කාලයක් සේවය කිරීමට ඉඩදෙනු ලැබේ.

6. මෙම තනතුරු වලට අදළ වන වැටුප් පරිමාණයන් 1970 නාවික වැටුප් සංග්‍රහය අනුවය. ප්‍රසිද්ධ කර ඇති තනතුරුවලට අදළ වන වැටුප් පරිමාන යන්ගේ උඩක මෙසේය :

| | 1 වැනි කාණ්ඩයේ වැටුප් පරිමාණය | විශේෂ කාණ්ඩයේ වැටුප් පරිමාණය |
|---|---|---|
| II වැනි හෝ III වැනි පන්තියේ ශිල්පින් | ... රු. 4,920—10 × 90—5,820... | — |
| I වැනි පන්තියේ ශිල්පි හෝ ප්‍රධාන ශිල්පි | ... — | ... රු. 5,940—10 × 90—6,840 |
| පාලක ප්‍රධාන සුළු නිලධාරි | ... — | ... රු. 6,840—10 × 144—7,920 |

පහත සඳහන් දීමනා අදළ වනු ඇත.

(අ) විවාහක දීමනාව ... ආණ්ඩුවේ සේවාවේ ඇති පරිපාටි, පරිමාණ සහ කොන්දේසි අනුව ගෙවනු ලැබේ.

(ආ) රජක දීමනාව ... (i) නේවාසිකාගාරයක වෙසෙන නැවියකුගේ නිල ඇඳුම් නාවික හමුදා වියදමෙන් සෝද ගැනීමට හිමිකම් ඇත.

(ii) නේවාසිකාගාරයකින් පිටත වෙසෙන නැවියෙකුට ඔහුගේ නිල ඇඳුම් සේදීම පිණිස නාවික හමුදාපති විසින් නියම කරනු ලබන දීමනාවකට හිමිකරුවෙකු වනු ඇත. කොන්ත්‍රාත් කරුවෙකු ඇති ප්‍රදේශ වල දනට පවත්නා පරිමාණය මසකට රු. 4 කි.

(ආ) යහපත් හැසිරීම සඳහා ගෙවීම ... පහත සඳහන් ප්‍රමාණයන් අනුව යහපත් හැසිරීමේ ලාංඡන හිමි ලාංඡන හිමි සෑම නැවියෙකුටම ඔහුට අදාල වන පරිදි යහපත් හැසිරීම සඳහා ගෙවීම් දෙනු ලැබේ.

| | | දෛනික ප්‍රමාණය |
|---|---|---|
| (i) එක් ලාංඡනයකට—අවුරුදු 4ක සුදුසුකම් ලැබීමේ සේවා කාලයකින් පසු | ... | රු 0 ශත 25 |
| (ii) ලාංඡන දෙකකට—අවුරුදු 8ක සුදුසුකම් ලැබීමේ සේවා කාලයකට පසු | ... | රු 0 ශත 50 |
| (iii) ලාංඡන තුනකට—අවුරුදු 12 ක සුදුසුකම් ලබන සේවා කාලයකින් පසු | ... | රු 0 ශත 75 |

පළකර ඇති තනතුරු සුළු නිලධාරි (නාවික හමුදාවේ) හෝ සැරයන් (යුද්ධ හමුදාවේ) තත්ත්වයකට සමානය. අධිකාරි නොලත් නිලයේ දී යුද්ධ හමුදාවේ 1 වැනි පන්තියේ බලලත් නිලධාරි තත්ත්වය හා සමාන පාලක ප්‍රධාන සුළු නිලධාරි (නාවික හමුදාවේ) තත්ත්වය දක්වා උසස් විය හැක. අධිකාරියක් දැරීමට සුදුසුයයි පෙනී ගිය අවස්ථාවල දී කාර්මික නිලධාරීන් වශයෙන් අධිකාරි ධුරයන්ට පත් කිරීම්වද, අවස්ථා ඇත.

7. බඳවා ගැනීම සඳහා කෙරෙන ඉල්ලුම් පත් පහත සඳහන් නීතිරීති අනුව විය යුතුය :—

(අ) මෙම නිවේදනය අවසානයෙහි දක්වෙන ආදර්ශ ආකෘතිය අනුව අයදුම්කරුගේ අත් අකුරෙන්ම ඉල්ලුම්පත් ලියා තිබිය යුතුය.

(ආ) ඉල්ලුම් පත්, කොළඹ 1, තැ.පෙ. 593, ශ්‍රී ලංකා නාවික හමුදාවේ බඳවා ගැනීමේ නිලධාරි වෙත එවිය යුතුය. කවරයේ වම් කෙළවරේ උඩ ' බඳවා ගැනීම—ශිල්පී අංශය ' යනුවෙන් ලියා 1975 අප්‍රේල් 30 වැනි දින ප.ව. 3.30 ට පෙර නාවික හමුදා මූලස්ථානයට ලැබිය යුතුය. රජයේ සේවකයන්ගේ ඉල්ලුම් පත් තම දෙපාර්තමේන්තු ප්‍රධානීන් මගින් එවිය යුතු අතර, තෝරා ගනු ලැබුවහොත් අයදුම් කරු මුදා හැරිය හැකි බව සඳහන් ලිපියක් දෙපාර්තමේන්තු ප්‍රධානියාගෙන් මේ සමග එවිය යුතුය.

(ඇ) ඉල්ලුම් පත් සමග පහත සඳහන් ලියකියවිලිවල පිටපත් පමණක් එවිය යුතුය.

(i) උප්පැන්නය ලියාපදිංචි කිරීමේ සහතිකය හෝ උපත ලියා පදිංචි නොකරනු ලැබූ අයදුම් කරුවන් වෙනුවෙන් රෙජිස්ට්‍රාර් ජනරාල් විසින් නිකුත් කරනු ලබන විශේෂ වයස් සහතිකය.

සැ.යු.—වයස සනාථ කිරීම පිණිස බෞතිස්ම සහතික, උපකෘත පාඨශාලා ව්‍යවස්ථා සඳහා නිකුත් කෙරෙන උප්පැන්න සහතික, හඳහන් ආදිය භාරගනු නොලැබේ.

(ii) ලබා ඇති උසස්ම අධ්‍යාපනික සුදුසුකම් පිළිබඳ සහතික සහ මෙම දැන්වීමේ 2 (ආ) ඡේදයේ සඳහන් වන අධ්‍යාපනික අවශ්‍යතා සනාථ කිරීමේ සහතික.

(iii) මෙම දැන්වීමේ 2 (ඇ) ඡේදයේ සඳහන් කර ඇති පරිදි හැකිනම් ලබා ඇති කාර්මික සුදුසුකම් පිළිබඳ සහතික.

(iv) පත්වීම සඳහා අයදුම්කරුගේ සුදුසුකම්, චරිතය සහ යෝග්‍යතාවය පිළිබඳ මෑතදී ලබාගත් චරිත සහතික හතරක්, ඉන් එකක් තම ප්‍රදේශයේ ග්‍රාම සේවකයෙන් විය යුතු අතර, අනෙක තමාගේ වර්තමාන හෝ මීට ප්‍රථම හෝ සේවා යෝජකයාගෙන් විය යුතුය.

(v) අයදුම්කරුගේ ඉකුත් උපන් දිනයේ දී හෝ ඊට පසුව ගත් ඡායාරූපයක් ද, එවිය යුතුය. එහි පසු පිටෙහි අයදුම්කරු විසින් අත්සන් කළ යුතුය.

සටහන.—උප්පැන්නය ලියාපදිංචි කිරීමේ සහතිකයෙහි සහ අධ්‍යාපනික සහතිකවල අයදුම් පත්‍රයේ සඳහන් කර ඇති නම නොවෙනස්ව තිබිය යුතුය. අයදුම් පතෙහි සහ ඡායාරූපයෙහි යොදන අත්සන අයදුම්කරුගේ සාමාන්‍ය අත්සන විය යුතුය.

8. ස්ථිර නාවික බලකායට බඳවා ගැනීම පිණිස තෝරාගනු ලබන අපේක්ෂකයින් 1956 වර්ෂයේ අංක 33 දරණ රාජ්‍ය භාෂා පනතේ විධිවිධාන ද, බඳවා ගනු ලබන අවස්ථාවේ දී රාජ්‍ය භාෂා පනත ක්‍රියාත්මක කිරීම් වස් නිකුත් කර ඇති හෝ නිකුත් කරනු ලබන හෝ සියළුම නියෝග හා උපදෙස් අනුගමනය කරන බවට ලියවිල්ලකින් ගිවිසිය යුතුය.

9. සේවාමුක්ත භටයෙකු මේ සඳහා ඉල්ලුම් කරන්නේ නම් ඉහත සඳහන් කර ඇති පොදු කොන්දේසි වලට අමතරව පහත සඳහන් දෑ ද සපුරාලිය යුතුය.

(i) ඔහුට බ්‍රිතාන්‍ය පොදු රාජ්‍ය මණ්ඩලීය සන්නද්ධ සේවාවක හෝ ලංකාවේ හමුදාවක අවුරුද්දකට නො අඩු සේවා කාලයක් ඇති බවට ;

(ii) සන්නද්ධ සේවයෙන් මුදාහරිනු ලැබූ විට ඔහුගේ පූර්ව සේවය ' ඉතා හොඳයි ' තත්ත්වයට වඩා නො අඩුව වර්ග කර ඇති බවට ;

(iii) ඔහුගේ සක්‍රිය සේවා කාලයේ අවුරුදු, මාස, හා දින ගණන.

10. සහතික වල මුල් පිටපත් ඉදිරිපත් කළ යුත්තේ අයදුම්කරු සම්මුඛ පරීක්ෂණයකට කැඳවනු ලැබූ විට පමණි. ඉල්ලුම්පත සමඟ එවන කිසිම ලේඛනයක මුල් පිටපතක් නැති වුවහොත් නාවික හමුදා මූලස්ථානය වග කියනු නො ලැබේ.

11. තැපැලේ දී නැති වන හෝ ප්‍රමාද වන ඉල්ලුම් පත් පිළිබඳ කෙරෙන චෝදනාවන් ගැන සලකා බලනු නො ලැබේ.

12. ලැබෙන සියළුම ඉල්ලුම්පත් ලද බැව් දන්වනු ඇත.

13. දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් එවනු ලබන ඉල්ලුම්පත් ඒවා භාරගන්නා අවසාන දිනට පසුව මෙම කාර්යාලයට ලැබුණේ නම් භාර ගන්නා අවසාන දිනට පෙර දෙපාර්තමේන්තු ප්‍රධානියාට ලැබී ඔහු විසින් ප්‍රමාදය පිළිබඳව පිළිගත හැකි කරුණු සහිතව ඉදිරිපත් කළ හොත් පමණක් භාරගනු ලැබේ.

14. සුදුසු සේ සැලකෙන අයදුම්කරුවන් ලිපියකින් දන්වා එවන දින සහ වේලාව අනුව නාවික හමුදා තේරුම් මණ්ඩලය මගින් පැවැත්වෙන සම්මුඛ පරීක්ෂණ එකක් හෝ කීපයක් සඳහා පෙනී සිටීම අවශ්‍යය. සම්මුඛ පරීක්ෂණ වලින් බඳවා ගැනීම සඳහා සුදුසු යයි තෝරනු ලැබූ අයදුම්කරුවන් බඳවා ගැනීමට පෙර කොළඹ දී පැවැත්වෙන වෛද්‍ය පරීක්ෂණ එකක් හෝ කීපයක් සඳහා ද, ඉදිරිපත් විය යුතුය. සම්මුඛ පරීක්ෂණ හෝ වෛද්‍ය පරීක්ෂණ සඳහා ගමන් ගාස්තු හෝ වෙන කිසි වියදමක් හෝ ගෙවනු නො ලැබේ.

15. ඉල්ලුම්කරුවකු නිර්දේශ කිරීමට කැමැති කෙනෙකු වේ නම්, ඔහු විසින් ඉල්ලුම්කරුට සහතිකයක් දිය යුතුය. ඉල්ලුම්කරුවකුගේ තෝරා ගැනීම පිළිබඳව යම් කිසි පෙළඹවීමක් හෝ බලපෑමක් සඳහා ප්‍රයත්නයක් දරනු ලබන්නේ නම් ඒ හේතුවෙන් ඉල්ලුම්කරු ඒ තනතුර සඳහා නුසුදුස්සකු වීමට ඉඩ තිබේ.

16. යම් ඉල්ලුම්කරුවෙකුගේ ඉල්ලුම් පත්‍රයෙහි යම් කිසි අසත්‍ය තොරතුරක් සඳහන් කොට තිබෙන බව ඔහු තෝරා ගැනීමට පෙර සොයා ගත්තේ නම් ඒ හේතුවෙන්ම ඔහු යථෝක්ත තනතුර සඳහා නුසුදුස්සකු බවට පත් කිරීමටත්, බඳවා ගැනීමෙන් පසුව අනාවරණය වුනි නම් විනයානුකූලව ක්‍රියා කිරීමට සහ නාවික හමුදාවෙන් පහ කිරීමටත් ඉඩ තිබේ.

1975 මාර්තු මස 24 වැනි දින,
කොළඹ දී ය.

ඩී. බී. ගුණසේකර,
කොමදෝරු,
නාවික හමුදාධිපති.

### අයදුම් පත්‍රය

නැවියන් සඳහා ඇබෑර්තු—ශ්‍රී ලංකා නාවික හමුදාව

1. සම්පූර්ණ නම (පැහැදිලි අකුරෙන්) :————.
2. තැපැල් ලිපිනය :————.
3. පළාත :————.
4. ඡන්ද කොට්ඨාශය :————.
5. උපන් දිනය :————.
6. 1975 අප්‍රේල් 01 වැනි දිනට වයස :————.
7. සමර්ථ වී ඇති විෂයයන් සහ දිනයන් සහිතව අධ්‍යාපනික සුදුසුකම් :————.
8. ඉගෙනීම් ලැබූ පාසල් :————.
9. වෙනත් සුදුසුකම් :————.
10. ක්‍රීඩා පිළිබඳ දක්ෂතාවය :————.
11. පාසැල් හැර යාමේ සිට රැකියාවල් (සම්පූර්ණ විස්තර) :————.
12. දැන් රැකියාව :————.
13. උස : අඩි :———— අඟල් :————. බර : රාත්තල් :————. පපුව : අඟල් :————.
14. ජාතිය :————.
15. ආසන්න පොලිස් ස්ථානය :————.
16. නාවික, යුද්ධ, ගුවන් හමුදා සහ ස්වේච්ඡා සේවා ඇත්නම්, එහි සම්පූර්ණ විස්තර :————.
17. මුදු හැරීමේ දී/අස්කිරීමේ දී හැසිරීම :————.
18. වෙනත් අදාළ විස්තර :————.
19. සහතික ඉදිරිපත් කරන්නන්ගේ නම් සහ තනතුරු :—
    (අ) ————කොට්ඨාශයේ ග්‍රාම සේවක
    (ආ) :————.
    (ඇ) :————.
    (ඈ) :————.

ඉහත සඳහන් විස්තර මාගේ දැනීමේ හා විශ්වාසයේ හැටියට සත්‍ය බව ප්‍රකාශ කරමි.

————.
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

4-14—75.04.04 දින අංක 158 දරණ ගැසට් පත්‍රය

---

# විභාග. විභාග ප්‍රතිඵල ආදිය

### ලංකා විභාග දෙපාර්තමේන්තුව

**කෘෂිකර්ම දෙපාර්තමේන්තුවට රසායනාගාර සහායකයින් බඳවාගැනීම පිණිස පැවැත්වෙන විභාගය**

කෘෂිකර්ම දෙපාර්තමේන්තුවට රසායනාගාර සහායකයින් බඳවා ගැනීම පිණිස විභාගයක් 1975 මැයි මස 31 වැනි දින කොළඹ දී පැවැත්වේ. මෙම තනතුරු තරග කළ හැක්කේ පිරිමි අපේක්ෂක යින්ට පමණකි. මෙම තනතුරු සඳහා අවශ්‍ය සුදුසුකම්, වැටුප් විස්තර ආදිය පහත පළවේ.

**තනතුරට අදාළ වැටුප් පරිමාණය**

(අ) I ශ්‍රේණිය අවුරුද්දකට රු. 5,304—8×144—රු. 6,456 ඒකාබද්ධ වැටුපක්.

(ආ) II ශ්‍රේණිය අවුරුද්දකට රු. 3,144—15×144—රු. 5,304 ඒකාබද්ධ වැටුපක්.
(රු. 3,720 ට සහ රු. 4,584 ට පෙර කාර්යක්ෂමතා කඩඉම්.)

(ඇ) III ශ්‍රේණිය අවුරුද්දකට රු. 2,760—4×60 සහ 17×90—රු. 4,530 ඒකාබද්ධ වැටුපක්. (රු. 3,360 ට සහ රු. 3,720 ට පෙර කාර්යක්ෂමතා කඩඉම්.)

සංලක්ෂය.—කවර අවස්ථාවකදීවත් I ශ්‍රේණියේ පත්වීම් සංඛ්‍යාව II ශ්‍රේණියේ පත්වීම් සංඛ්‍යාවේ හයෙන් එක් කොටසකට වඩා අධික නොවනු ඇත. I ශ්‍රේණියට පත්වීම් කරනු ලබන්නේ ජ්‍යෙෂ්ඨතාව හා කුසලතාව මත තෝරාගත් නා II ශ්‍රේණියේ නිලධරයන් අතුරෙනි. III ශ්‍රේණියට පත්වීම් කරනු ලබන්නේ රසායනාගාර උප සහායක ශ්‍රේණියෙනි.

2. සේවා කොන්දේසි.—(i) තෝරාගනු ලබන අපේක්ෂකයන් දෑවුරුදු පුහුණු පාඨමාලාවක් හැදෑරිය යුතුය. පළමුවන අවුරුද්ද කෘෂිකර්මයේ මූල ධර්ම, සත්ව පාලනය හා පශු විද්‍යාව, කෘෂිකාර්මික රසායන විද්‍යාව, කෘෂිකාර්මික උද්භිද විද්‍යාව, කීට විද්‍යාව හා පැළෑටි රෝග නිධාන විද්‍යාව යන මේවායෙන් තෝරාගත් අංශයක් පිළිබඳ දේශණයන්ට හා ප්‍රායෝගික කටයුතුවලට සීමාවේ. පළමුවන අවුරුද්ද අවසානයේ දී පරීක්ෂණයක් පැවැත්වේ. මෙයින් අසමත්වන අපේක්ෂකයන් අස්කර දැමීමට යටත්වන නමුදු එයින් සමත්වීම් වස් උපරිම වශයෙන් තවත් තුන් වරක් උත්සාහ කිරීමට ඔවුන්ට ඉඩ දෙනු ලැබේ. දෙවන අවුරුද්ද කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ පරීක්ෂණ අංශ වන උද්භිද විද්‍යා, කෘෂිකාර්මික රසායන විද්‍යා, පැළෑටි රෝග නිධාන විද්‍යා, කීට විද්‍යා හා පශු විද්‍යා යන මේවායින් එක් අංශයක ප්‍රධානියා යටතේ ගත කරන අන්තේවාසික කාලයක් වේ. අන්තේවාසික පුහුණු කාලය තුළදී වැඩ සහ හැසිරීම අසතුටුදායක වන අපේක්ෂකයෝ කෘෂිකර්ම අධ්‍යක්ෂ විසින් තීරණය කෙරෙන පරිදි සේවය නවතනු ලැබීමට හෝ අවුරුද්දකට නොවැඩි කාලයකින් අන්තේවාසික කාලය දීර්ඝ කරනු ලැබීමට හෝ යටත්වෙති. දෑවුරුදු පුහුණු පාඨමාලාව සාර්ථක ලෙස සම්පූර්ණ කරන අපේක්ෂකයෝ තුන් අවුරුදු පරිවාස කාලය මත II ශ්‍රේණියේ රසායනාගාර සහායකයන් වශයෙන් පත් කරනු ලැබේ.

(ii) (අ) මෙම තනතුරු වූ කලී ස්ථිරය. විශ්‍රාම වැටුප් රහිතය. රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට දායක ව ඇත.

(ආ) 1971 දෙසැම්බර් 31 වෙනි දිනට විශ්‍රාම වැටුප් සහිත තනතුරු උසුලමින් සිටි දැනටමත් රාජ්‍ය සේවයේ යෙදී සිටින අපේක්ෂකයින් මෙම විභාගයේ ප්‍රතිඵල අනුව පත්වීම් සඳහා තෝරාගනු ලැබුවහොත් ඔවුන් විශ්‍රාම වැටුප් අයිතිවාසිකම් භුක්ති විඳින අතර, විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් ගෙවිය යුතු වනු ඇත.

(ඊ) හැඳින්වීමේ පත්‍රය (සම්මුඛ පරීක්ෂණයක් පැවැත්වෙතොත් ඒ සඳහා මෙය රැගෙන ආ යුතුය).

(ν) විභාගයට ඉල්ලුම් කරන අවස්ථාවේදී වුවමනා සියලුම ලියකියවිලි සුදානම්ව තබාගන්නා ලෙස අපේක්ෂකයන්ට අවවාද කරනු ලැබේ. සම්මුඛ පරීක්ෂණයක් පැවැත්වෙතොත් ඒ අවස්ථාවේදී අවශ්‍ය ලියකියවිලි ඉදිරිපත් කරන්ට අපොහොසත් වන හෝ කෘෂිකර්ම අධ්‍යක්ෂ විසින් ඉල්ලා සිටි කල්හි ඒවා ඉදිරිපත් කිරීම ප්‍රමාද කරන හෝ අපේක්ෂකයෙකු වෙතොත් ඔහුගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ.

11. මුදල් ආපසු ගෙවීම.—කිසිම කරුණක් නිසා හෝ විභාග ගාස්තු ආපසු ගෙවනු නොලැබේ. මෙම විභාගය වෙනුවෙන් ගෙවන ලද ගාස්තු වෙන කිසිම විභාගයක් සඳහා මාරු කළ හැකි නොවේ.

12. විභාග පරිපාටිය.—විභාගය සඳහා ඇති විෂයයන් සහ එක් එක් විෂයය වෙනුවෙන් නියමිත ලකුණු පහත දැක්වේ. නරක අකුරු සහ අක්ෂර වින්‍යාස දෝෂ වෙනුවෙන් ලකුණු අඩුකරනු ලැබේ. නොපැහැදිලි අකුරු ඇති අපේක්ෂකයන් නුසුදුස්සන් ලෙස සැළකීමට ඉඩ තිබේ.

(i) භාෂාව හා රචනය (සිංහල/දෙමළ/ඉංග්‍රීසි) ... ... (පැය 1 යි) ලකුණු 50

(ii) රසායන විද්‍යාව (සිංහල/දෙමළ/ඉංග්‍රීසි) ... ... (පැය 2 යි) ලකුණු 100

(iii) භෞතික විද්‍යාව හෝ ජීව විද්‍යාව හෝ කෘෂිකර්මය) (සිංහල/දෙමළ/ඉංග්‍රීසි) ... ... (පැය 1 යි) ලකුණු 50

(iv) සාමාන්‍ය බුද්ධි පරීක්ෂණය (සිංහල/දෙමළ/ඉංග්‍රීසි ... (පැය ½ යි) ලකුණු 50

මෙම විභාගයට නියමිත විෂය නිර්දේශය අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය) විභාගයට මෙනි.

13. කාල සටහන.—මෙම විභාගයට නියමිත කාල සටහන මෙසේය. වෙනම කාල සටහනක් නිකුත් නොකරන බැවින් මෙය පිටපත් කර තබාගැනීම අයදුම්කරුවන්ට ප්‍රයෝජනවත් වනු ඇත.

1975 මැයි මස 31 දින

පෙරවරු 9-10 දක්වා ... භාෂාව හා රචනය.

පෙරවරු 10.15-11.15 දක්වා ... භෞතික විද්‍යාව හෝ ජීව විද්‍යාව හෝ කෘෂිකර්මය.

පෙරවරු 11.30-12 දක්වා ... සාමාන්‍ය බුද්ධි පරීක්ෂණය.

පස්වරු 1-3 දක්වා ... රසායන විද්‍යාව.

14. අසත්‍ය තොරතුරු සැපයීම ගැන දඬුවම්.—මෙම විභාගයේ රෙගුලාසි අනුව යම් අපේක්ෂකයෙකු නුසුදුසු බව පෙනී ගියහොත් විභාගයට පෙර හෝ එය එසේ නැතහොත්, ඔහු මෙම විභාගයට පෙනී සිටීමට නුසුදුස්සෙකුව සිටි බව ඔහුගේ සේවා කාලය තුළ කිසියම් අවස්ථාවකදී මතු වුවහොත් ඔහු සේවයෙන් පහ කිරීමට හේතුවනු ඇත.

ඊ. අබේරත්න,
කෘෂිකර්ම අධ්‍යක්ෂ.

1975 මාර්තු මස 19 වැනි දින,
පේරාදෙණියේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ දී ය.

### ආදර්ශ අයදුම් පත්‍රය

ලංකා විභාග දෙපාර්තමේන්තුව

රසායනාගාර සහායකයින් බඳවාගැනීම—කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

විභාග අංකය: ————

(1) මුලකුරු සමග අගට යෙදෙන නම :————.

(2) මුලකුරුවලින් හැඳින්වෙන නම් :————.

(3) සම්පූර්ණ ලිපිනය (ආණ්ඩුවේ සේවයේ යෙදී සිටින අපේක්ෂකයින් කාර්යාලයීය ලිපිනය සඳහන් කළ යුතුය) :————.

(4) සුදුසුකම් :—

(අ) උපන් දිනය :————.

(ආ) අධ්‍යාපනික සුදුසුකම් :————.

(ඇ) ඔබ ලංකාවේ පුරවැසියෙකු වන්නේ පරම්පරාවෙන් ද නැතහොත් ලියාපදිංචි වීමෙන් ද යන වග :————.

(ඈ) විභාගයට පෙනී සිටීමට ඔබේ ඇති සුදුසුකම් පිළිබඳ අතිකූත් විස්තර :————.

(5) විභාගයේ දී ඔබ පෙනී සිටින විෂයයන් :—

| විෂයය | මාධ්‍යය |
|---|---|
| (1) භාෂාව හා රචනය | ............................... |
| (2) රසායන විද්‍යාව | ............................... |
| (3) සාමාන්‍ය බුද්ධි පරීක්ෂණය | ............................... |
| (4) | ............................... |

(6) (i) ඉහතින් මා දී ඇති තොරතුරු මගේ දැනීම හා විශ්වාසය පරිදි සත්‍ය බවත් මෙයට අලවා ඇත්තේ කලින් පාවිච්චි නොකරන ලද වලංගු මුද්දර බවත්, මෙයින් දිවුරා සහතික කරමි.

(ii) මෙම විභාගය පිළිබඳ නීතිරීතිවලට යටත් වීමට එකඟ වෙමි.

(7) මුද්දර කොටුව :—

සැලකිය යුතුයි.—විභාගාපේක්ෂකයා නිවේදනයෙහි 7 ඡේදය ප්‍රකාර මුද්දර මෙම කොටුවෙහි අලවා ඒ උඩ අත්සන සහ දිනය යොදා අවලංගු කළ යුතුය. මුද්දර එක පිට එක ඇලවිය යුතු නොවේ.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

(8) අයදුම්කරුගේ අත්සන සහතික කිරීම :—

.......................... සේවයේ නියුක්ත/පදිංචි............ ............නමැති අය පෞද්ගලික වශයෙන් දන්න අඳුනන බවත්, 19 .......................... මස ............... වැනි දින ඔහු/ඇය මා ඉදිරිපිටදී අත්සන් කළ බවත් මෙයින් සහතික කරමි.

සහතික කරන අයගේ අත්සන :————.

නම, පදවිය හා තරාතිරම :————.

ලිපිනය :————.

දැනට රජයේ සේවයේ යෙදී සිටින්නන්ගේ අත්සන සහතික කළ යුත්තේ අදාළ දෙපාර්තමේන්තු ප්‍රධානියා හෝ ඔහු වෙනුවෙන් එසේ කිරීමට බලය ලත් නිලධාරියෙකු විසිනි.

ලංකා විභාග දෙපාර්තමේන්තුව

විභාගාපේක්ෂකයන් සඳහා නීති

සියළුම විභාගාපේක්ෂකයන් පහත සඳහන් නීති පිළිපැදීමට බැඳී සිටිය යුතුය. මේ නීති කිසිවක් උල්ලංඝනය කරන විභාගාපේක්ෂකයකුට විභාග කොමසාරිස්ට අභිමත පරිදි පහත සඳහන් දඬුවම් එකක් හෝ ඊට වැඩි ගණනක් පමුණුවනු ලැබේ :—

(i) මුළු විභාගයටම හෝ ඉන් කොටසකට නැතහොත් එක් විෂයයකට හෝ ඉන් කොටසකට හෝ පෙනී සිටීම තහනම් කිරීම.

(ii) විභාගයේ එක් විෂයයකට හෝ මුළු විභාගයටම හෝ නුසුදුස්සෙකු කිරීම.

(iii) එක් අවුරුද්දකට හෝ අවුරුදු දෙකකට හෝ කිසිම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම.

(iv) මුළු ජීවිත කාලයේම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම.

(v) සහතික පත්‍රය යම්කිසි කාල සීමාවක් තුළ තහනම් කිරීම.

(vi) විභාගාපේක්ෂකයාගේ ක්‍රියා පරිපාටිය සම්බන්ධයෙන් ඔහු ගැන වගකියයුත්තන්ට සැලකර සිටීම හෝ විභාගාපේක්ෂකයා පොලීසියට භාරදීම හෝ ඔහුගේ ක්‍රියාව සම්බන්ධයෙන් පොලීසියට පැමිණිලි කිරීම.

විභාගයට කලින් හෝ විභාගය පවත්වාගෙන යන අතරතුර හෝ විභාගයට පසුව හෝ කොයිම අවස්ථාවකදී වුවත් එවැනි විභාග අපේක්ෂකයෙකු සම්බන්ධයෙන් ක්‍රියා කිරීමේ බලය විභාග කොමසාරිස් සතුවේ. ඒ සම්බන්ධයෙන් ඔහුගේ තීරණය අවසාන තීරණය වන්නේ ය. එහෙත්, රජයේ සේවකයන් බඳවා ගැනීම සඳහා පවත්වනු ලබන විභාග පිළිබඳව විභාග කොමසාරිස්ගේ තීරණය රාජ්‍ය සේවා උපදේශක මණ්ඩලයේ සමීක්ෂණයට යටත් වන්නේ ය.

නීති

(1) සියළුම විභාගාපේක්ෂකයන් විභාග ශාලාව තුළදීත් ඒ අසලදීත් විභාගශාලාධිපතීන්ට ද ඔහුගේ සහකාරයන්ටද අනික් විභාගාපේක්ෂකයන්ටද බාධාවක් හෝ අවහිරයක් හෝ ඇති නොවන ලෙස ශාන්ත දාන්තව හැසිරිය යුතුයි. විභාග ශාලාවට ඇතුළුවන විටත්, පෙරත් ඉන් පිටවන විටත් ඉතා සන්සුන් ලීලාවෙන් හැසිරිය යුතුය.

(v) විභාගාපේක්ෂකයන් තම තමන්ගේ පෑන්, පැන්සල්, තීන්ත කුඩු, මකන රබර් කෑලි, අඩි කෝදු, ජ්‍යාමිති උපකරණ, පාට පැන්සල් පෙට්ටි, පාට හුණු පෙට්ටි යනාදිය රැගෙන ආ යුතුයි.

(vi) තමන් පාවිච්චි කරන සෑම කඩදාසියකම පිළිතුරු ලිවීමට පටන් ගැනීමේදී නොපමාව තමන්ගේ විභාග අංකය හා විභාගයේ නමත් පැහැදිලි ලෙස ලියන්න. කඩදාසියේ දෙපැත්තේම පැහැදිලි වද, පිරිසිදුවද උත්තර ලියන්න. ප්‍රශ්නයක කොටසකට උත්තර ලිවීමෙන් පසු අනික් කොටස පටන් ගැනීමට පෙර එක රූලක් වත් හිස්ව තැබිය යුතුයි. සම්පූර්ණ ප්‍රශ්නයකට උත්තර ලිවාට පසු රූලක් හෝ රූල් කීපයක් හිස්ව තබන්න. ලියන හැම දෙයක්ම එකගොඩේ තෝරා බේරා ගන්නට නොහැකි ලෙස නොලිය යුතුයි.

(vii) උත්තර ලියන කඩදාසියෙහි වම් පැත්තේ තීරය වෙන් කර ඇත්තේ ප්‍රශ්නවලට අංක ලිවීම සඳහාය. දකුණු පැත්තේ තීරය වෙන්කර ඇත්තේ පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා බැවින්, එහි කිසිවක් නොලිය යුතුයි. තමන් විසින් උත්තර ලියන ලද ප්‍රශ්නවලට අංක වරදවා යෙදීම ව්‍යාකූලත්වයට හේතු වන බැවින් ප්‍රශ්න අංක ඉතා පරෙස්සමෙන් නිවැරදි ලෙස යෙදිය යුතුයි.

(viii) අනිවාර්ය ප්‍රශ්න ද තෝරාගත යුතු අන් ප්‍රශ්න ද සම්බන්ධව ප්‍රශ්න පත්‍රයේ මුලින්ම සඳහන්කොට ඇති උපදෙස් ඉතා පරෙස්සමෙන් කියවා බැලිය යුතුයි. මෙය නොසලකා හැරී මෙන් බොහෝ විට පාඩු සිදුවිය හැකිය.

(ix) ගණිත ප්‍රශ්නවලට උත්තර සපයන විට ගැන බැලීම සහ කටුවැඩ ඒ ඒ ගණන සෑදීමේ කොටසක් වශයෙන්, අනුක්‍රමයෙන් විස්තර ලෙස දක්විය යුතුයි. අවශ්‍ය තැන්වල අඳිනු ලබන රූප සටහන් සහ චිත්‍ර ආදිය නිවැරදිව ද සෑහෙන පමණ විශාලවද තිබිය යුතුයි. පිටු කීපයකට යන දිග පිළිතුරුවලදී එක පිටුවක අඳින ලද රූප සටහනක් සම්බන්ධයෙන් ඊළඟ පිටුවලදීත් සිත් යොමුකර විය යුතු අවස්ථාවලදී ඒ රූප සටහන නැවත නැවතත් ඇඳ පෙන්වීම යෝග්‍ය වේ.

(x) එක් එක් ප්‍රශ්න පත්‍රයකට පිළිතුරු සපයා අවසන්වූ විට උත්තර ලියන ලද කඩදාසි සියල්ලම ප්‍රශ්න පත්‍රවලට උත්තර ලියූ පිළිවෙල අනුව එකතුකොට වම් පැත්තේ ඉහළ කෙළවරවල් තමන්ට සපයන ලද නූල් කෑබැල්ලෙන් නොගැලවී යන පරිදි එකට තබා අමුණා ගැට ගසන්න. දකුණු පැත්තේ උඩ කෙළවර වල් එකට තබා ගැට නොගසන්න.

(xi) ඔබගේ උත්තර පත්‍රය විභාගශාලාධිපතීන්ට හෝ ඔහුගේ සහකාර මහතෙකුට හෝ සියතින්ම බාර දිය යුතුය. නැතහොත් ඒවා එකතු කරනතුරු ඔබේ අසුනේම වාඩිවී සිටිය යුතුය. මෙසේ නොකිරීම ඇතැම් විට ඔබගේ උත්තර පත්‍රය නැතිවී යාමටද ඔබ යම් විෂයයකට ඉදිරිපත් නොවූවකුසේ සළකනු ලැබීමටද හේතු විය හැකිය. මොනම කරුණක් නිසාවත් ඔබගේ උත්තර පත්‍රය විභාග ශාලාවේ සේවය කරන පියුන් කෙනෙකුට හෝ වෙන යම් සේවකයෙකුට හෝ බාර නොදිය යුතුය.

(xii) යම්කිසි කරුණක් නිසා විභාගශාලාධිපතීන්ට හෝ ඔහුගේ සහකාර මහතෙකුට හෝ කථාකිරීම අවශ්‍ය වූ විටදී, කඩදාසි ආදිය අවශ්‍ය වූ විටද තම ආසනයෙන් නොනැගිට අත පමණක් එසවිය යුතුයි.

විභාග කොමසාරිස්.

විභාග දෙපාර්තමේන්තුව,
මැලේ වීදිය, කොළඹ 2.

4-80—75.04.04 දින අංක 158 දරණ ගැසට් පත්‍රය

---

### ආරෝග්‍යශාලා ලිපිකරු සේවයේ II වැනි පන්තියේ 'අ' ඛණ්ඩයේ නිලධාරීන් සඳහා වූ කාර්යක්ෂමතා කඩඉම් විභාගය—1974

ආරෝග්‍යශාලා ලිපිකරු සේවයේ II වැනි පන්තියේ 'අ' ඛණ්ඩයේ නිලධාරීන් වන පහත සඳහන් අපේක්ෂකයින් ආරෝග්‍යශාලා ලිපිකරු සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ 15 වැනි ඡේදයෙහි සඳහන්ව ඇති 1974.8.25 දින පවත්වන ලද විභාගයේ දී එම නම්වලට ඉදිරියෙන් දැක්වෙන විෂයයන්ගෙන් සමත් වී ඇති බව පොදු දැනගැනීම සඳහා මෙයින් නිවේදනය කරනු ලැබේ :—

| | නම | සේවයකරන ස්ථානය | විෂයයන් |
|---|---|---|---|
| 1. | අබේරත්න බණ්ඩා ඒ. ආර්. | කෑගල්ල මූලික රෝහල | ගිණුම් |
| 2. | මණ්ඩාවල ජේ | මහනුවර ළය චිකිත්සාගාරය | ගිණුම් |
| 3. | නාමසේන යූ. ඩී. | කෑගල්ල සෞඛ්‍ය සේවා අධිකාරිය | ගිණුම් |
| 4. | ප්‍රේමරත්න, එච්. පී. | කොළඹ ක්ෂය රෝග මර්ධන ව්‍යාපාර කාර්යාලය | කාර්යාල ක්‍රම සහ කාර්ය පරිපාටිය |
| 5. | එලුර්නායගම්, එස්. | කලුබෝවිල, දකුණු කොළඹ රෝහල | කාර්යාල ක්‍රම සහ කාර්ය පරිපාටිය |
| 6. | අහමත්, ටී. ඒ. පී. | කොළඹ රිජ්වේ ආර්යා ළමා රෝහල | ගිණුම් |
| 7. | මීගස්දෙනිය, එම්. බී. | මහනුවර ළය චිකිත්සාගාරය | ගිණුම් |

පී.ජී. ජී. ධර්මසිරි,
නියෝජ්‍ය අධ්‍යක්ෂ (පාලන),
සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ වෙනුවට.

1975 මාර්තු මස 24 දින, කොළඹ,
සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලයේ දීය.

4-79—75.04.04 දින අංක 158 දරණ ගැසට් පත්‍රය

---

### අධ්‍යාපන අමාත්‍යාංශය

### සම්මන්තුරේ කණිෂ්ඨ කාර්මික ආයතනය—1975 අධ්‍යාපන වර්ෂය

සම්මන්තුර කණිෂ්ඨ කාර්මික ආයතනයට 1975 අධ්‍යාපන වර්ෂයේ, දෑවුරුදු සන්ධ්‍යාකාල (දෙමළ මාධ්‍ය) ව්‍යාපාර අධ්‍යාපන ජාතික සහතික පත්‍ර (ගණකාධිකරණය), පාඨමාලාව හැදෑරීමට හා දිවාකාල (දෙමළ මාධ්‍ය) ව්‍යාපාර අධ්‍යයන ජාතික සහතික පත්‍ර (ගණකාධිකරණය), පරිපාලන පරිචය හා ලඝු ලේඛනය පාඨමාලාව හැදෑරීම පිණිස පහත සඳහන් සුදුසුකම් ඇති අපේක්ෂකයන්ගෙන් අයදුම් පත් කැඳවනු ලැබේ. නිවේදනය අවසානයේ ඇති ආදර්ශ ආකෘති පත්‍ර අනුව පිළියෙල කරන ලද අයදුම් පත් 1975.04.30 වැනි දින හෝ ඊට ප්‍රථම, තම සේවා යෝජකයා මගින්, සම්මන්තුරේ කණිෂ්ඨ කාර්මික ආයතනයේ, විදුහල්පති වෙත ලේඛනගත තැපෑලෙන් එවිය යුතුයි. දිවා කාල පාඨමාලාව පවත්වනු ලබන්නේ පෙරවරු 8.30 සිට පස්වරු 4.30 දක්වාය. සන්ධ්‍යාකාල පාඨමාලාව පවත්වනු ලබන්නේ සවස 5.00 සිට 8.00 දක්වා බැවින් සවස 5.00 ට සම්මන්තුරේ කණිෂ්ඨ කාර්මික ආයතනයට පැමිණීමට සුදුසුකම් ඇති ස්ථාන වල රැකියාව කරන අයදුම්කරුවන් සඳහා විශේෂ සැළකිල්ලක් දක්වනු ඇත.

දිවා කාල පාඨමාලාව සඳහා ඇතුළත්වීමට බලාපොරොත්තුවන අයදුම්කරුවන්ගේ ඉල්ලුම් පත් කෙලින්ම සම්මන්තුරේ කණිෂ්ඨ කාර්මික ආයතනයේ විදුහල්පති වෙත ලේඛනගත තැපෑලෙන් එවිය යුතුයි.

2. අවශ්‍ය සුදුසුකම් :—

(අ) ගණිතය/වාණිජ අංක ගණිතය/අංක ගණිතය සහ දෙමළ භාෂාව ඇතුළුව දෙවරකට නොවැඩි වාර ගණනක දී විෂයයන් හයකින් අධ්‍යයන පොදු සහතික පත්‍ර (සා. පෙ.) විභාගය සමත්ව තිබීම ;

(ආ) 1975.01.01 දිනට වයස අවුරු 17 ට නොඅඩුවිය යුතුයි ;

(ඇ) රජයේ හෝ පළාත් පාලන ආයතනයක හෝ රජය පිළිගත් වෙනත් ආයතනයක හෝ මෙම පාඨමාලාව ප්‍රයෝජනවත් වන වෘත්තියක නියුක්තවීම.

3. ඇතුළත් කර ගැනීම.—අයදුම්කරුවන්ගෙන් සුදුසුස්සන් තෝරා ඇතුළත් කරගනු ලබන්නේ, තරග විභාගයකින් හෝ සම්මුඛ පරීක්ෂණයකින් හෝ ඒ දෙයාකාරයට උපයෝගීකර ගැනීමෙනි.

4. අයදුම් පත්‍ර.—පහත දක්වා ඇති ආදර්ශ ආකෘතිය අනුව යතුරු ලියන ප්‍රමාණයේ කඩදාසියක සකස්කරගත් අයදුම් පත්‍ර නිසිලෙස සම්පූර්ණ කර එවිය යුතුයි. අසම්පූර්ණ හෝ ප්‍රමාද වී ලැබෙන අයදුම් පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලබන බවත්, ඒ පිළිබඳව දැනුම් දීමක් නොකරනු ලබන බවත් සැළකිය යුතුයි.

5. (i) මෙම සන්ධ්‍යාකාල පාඨමාලාව සඳහා මසකට රු. 10 ක විද්‍යාල ගාස්තුවක් අයකරනු ලැබේ.

(ii) දිවාකාල පාඨමාලාව සඳහා විද්‍යාල ගාස්තුවක් අයකරනු නො ලැබේ.

ඕ. අමරසිංහ,
වැ. බ. අධ්‍යාපන අධ්‍යක්ෂ (කාර්මික අධ්‍යාපන),
අධ්‍යාපන අධ්‍යක්ෂ ජනරාල් වෙනුවට.

1975.03.24,
කොළඹ 2,
අධ්‍යාපන අමාත්‍යාංශයේ දී ය.

### ආදර්ශ අයදුම් පත්‍රය

පාඨමාලාවේ නම :—

(i) ව්‍යාපාර අධ්‍යයන ජාතික සහතික පත්‍ර. (ගණකාධිකරණ, පරිපාලන පරිචය, ලඝු ලේඛනය) දිවාකාල පාඨමාලාව (දෙමළ).

(ii) ව්‍යාපාර අධ්‍යයන ජාතික සහතික පත්‍ර (ගණකාධිකරණ) සන්ධ්‍යාකාල පාඨමාලාව (දෙමළ).

1. සම්පූර්ණ නම :————.
(පැහැදිලි අකුරින්)

2. මුලකුරු සමග නම :————.

3. උපන් දිනය :—අවුරුද්ද :——, මාසය :——, දිනය :——,
1975.01.01 දිනට වයස :—අවුරුදු :——, මාස :——, දින :——.
(උප්පැන්න සහතිකයේ පිටපතක් ඇමිණිය යුතුයි.)

4. සේවය කරන ස්ථානයේ ලිපිනය :————.

5. පෞද්ගලික ලිපිනය :————.

6 ස්ත්‍රී/පුරුෂ භාවය :————.

7. දැනට කරන රැකියාව :.................................. ඊට පත්වූ දිනය :......................

8. අධ්‍යාපන සුදුසුකම් :—(සමත්වී ඇති විභාගවල වර්ෂය, මාසය හා විභාග අංකය ද සමත් වූ ප්‍රවීණතා හා විෂයයන් ද සඳහන් කළ යුතුයි.)

ඉහත සඳහන් විස්තර සියල්ලම සත්‍ය බව සහතික කරමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

#### සේවා යෝජකයාගේ නිර්දේශය

........................................ විසින් ඉහත සඳහන් කර ඇති විස්තර මගේ කාර්යාලයේ ඇති ලියවිලි අනුව නිවැරදි බවත්, මෙම පාඨමාලාව හැදෑරීම ඔහුගේ සේවය සඳහා යෝග්‍ය බවත්, සහතික කරමි.

————,
සේවායෝජකයාගේ අත්සන,
නිල මුද්‍රාව.

දිනය :————.

අනවශ්‍ය වචන කපා හරින්න.)

4-73 — 75.04.04 දින අංක 158 දරණ ගැසට් පත්‍රය

---

### අධ්‍යාපන අමාත්‍යාංශය

### කෘෂිකර්මය පිළිබඳ තුන් අවුරුදු ජාතික තාක්ෂණික ඩිප්ලෝමා පාඨමාලාව සඳහා අම්පාරේ හාඩි ජ්‍යෙෂ්ඨ කාර්මික ආයතනයට 1975 අධ්‍යයන වර්ෂය

කෘෂිකර්මය පිළිබඳ ජාතික තාක්ෂණික ඩිප්ලෝමා පූර්ණකාලීන තුන් අවුරුදු පාඨමාලාව සඳහා අම්පාරේ හාඩි ජ්‍යෙෂ්ඨ කාර්මික ආයතනයට බඳවා ගැනීම සඳහා සුදුසුකම් ඇති පිරිමි අයදුම්කරුවන් ගෙන් ඉල්ලුම්පත් කැඳවනු ලැබේ. (දෑවුරුදු අධ්‍යයන කාලයක් ආයතනයේ දී ද තුන්වන වර්ෂය කෘෂිකාර්මික ආයතනයන්හි ද වේ).

සුදුසුකම්:

(අ) වයස.—1975 ජනවාරි පළවෙනිදාට අයදුම්කරුවන් අවුරුදු 16ට අඩු නොවිය යුතුය.

(ආ) අධ්‍යාපනික සුදුසුකම්.—ශුද්ධ ගණිතය, රසායන විද්‍යාව සහ එක් එක් භාෂාවක් සමග අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයෙන් විෂයයන් හයකින් එක් වරකදී සමත් වී තිබිය යුතු අතර මෙහි පහතින් දක්වෙන විෂයයන් සමූහයෙන් එම ව්‍යාවේදීම යටත් පිරිසෙයින් විෂයයන් දෙකකට සම්මාන සමග අඩු ගණනේ විෂයයන් තුනකින් සම්මාන සාමාර්ථයන් ලබා සිටිය යුතුය :—

(1) ශුද්ධ ගණිතය.
(2) භෞතික විද්‍යාව.
(3) රසායන විද්‍යාව.
(4) ජීව විද්‍යාව.
(5) කෘෂිකර්මය.
(6) භූගෝල විද්‍යාව.

මෙහි පහත දක්වෙන ආකෘති පත්‍රයට සෑම ආකාරයකින්ම අනුකූල වන පරිදි අයදුම් පත්‍ර පිළියෙල කළ යුතුයි. සෑම අයදුම් පතක්ම අම්පාරේ හාඩි ජ්‍යෙෂ්ඨ කාර්මික ආයතනයේ ලේඛකාධිකාරී වෙත 1975.04.30 වැනි දින හෝ එයට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපැලෙන් එවිය යුතුයි.

ඇතුලත් කිරීම සඳහා ශිෂ්‍යයන් තෝරාගනු ලබන්නේ 2 (ආ) ඡේදයේ සඳහන් විෂයයන් සමූහයේ සහ සම්මුඛ පරීක්ෂණයේ ප්‍රතිඵල මතය.

කාර්මිකර්ම පසුබිමක් ඇති අයදුම්කරුවන් කෙරෙහි වැඩි සැලකිල්ලක් දක්වනු ඇත.

ඕ. අමරසිංහ,
වැ. බ. අධ්‍යාපන අධ්‍යක්ෂ (කාර්මික අධ්‍යාපන),
අධ්‍යාපන අධ්‍යක්ෂ ජනරාල් වෙනුවට.

1975.03.24 දින,
කොළඹ 2, මැලේ වීදිය,
අධ්‍යාපන අමාත්‍යාංශයේ දීය.

#### කෘෂිකර්මය පිළිබඳ තුන් අවුරුදු ජාතික තාක්ෂණික ඩිප්ලෝමා පාඨමාලාව සඳහා අම්පාරේ හාඩි ජ්‍යෙෂ්ඨ කාර්මික ආයතනයට ඉල්ලුම් කිරීම—1975 අධ්‍යයන වර්ෂය

1. සම්පූර්ණ නම (පැහැදිලි අකුරෙන්) :————.

2. ලියුම් ලැබෙන ලිපිනය :————.

3. උපන් දිනය (අයදුම්කරුවන්ගේ උප්පැන්න සහතිකයේ මුල් පිටපත නොව පිටපතක් පමණක් ඇමිණිය යුතුය) :——.

4. 1975.01.01 වැනි දිනට වයස :—
අවුරුදු :——, මාස :——, දින :——.

5. ජාතිය :————.

6. (අ) අයදුම්කරුවන් විසින් ඉහත 2 (ආ) සටහනේ දක්වෙන සුදුසුකම් ලබාගත් අ.පො.ස. (සා.පෙ.) විභාගයේ අවුරුද්ද, මාසය සහ විභාග අංකය :—
අවුරුද්ද :——, මාසය :——, විභාග අංකය :——.

(ආ) විෂයයන් සමත් වී ඇති අන්දම (සාමාන්‍ය සාමාර්ථය, සම්මාන සාමාර්ථය, විශිෂ්ඨ සාමාර්ථයක් ද යන වග) :

| විෂයයන් | සාමාර්ථය |
|---|---|
| .......................... | .......................... |
| .......................... | .......................... |
| .......................... | .......................... |
| .......................... | .......................... |
| .......................... | .......................... |
| .......................... | .......................... |

7. දෙමව්පියන්ගේ හෝ භාරකරුගේ නම සහ ලිපිනය :————.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

4-74 — 75.04.04 දින අංක 158 දරණ ගැසට් පත්‍රය

## ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ

# දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අයකරනු ලබන සංශෝධිත ගාස්තු

**1968 දෙසැම්බර් මස 1 වෙනි දින සිට ක්‍රියාත්මක වේ.**

(සෑම සිකුරාද දිනයන්හි පළ කරනු ලැබේ)

1. සියළුම දැන්වීම් සහ ප්‍රකාශනයන් පළ කරනු ලබන්නේ ප්‍රසිද්ධ කරන්නාගේ වගකීම පිටය.

2. පෞද්ගලික පළ කරන්නන්ගේ සියළුම දැන්වීම් සහ ප්‍රකාශන, ඒ සඳහා නියමිත සම්පූර්ණ ගාස්තුවත් සමග කොළඹ රජයේ මුද්‍රණාලයාධිපති තැනට තැපැලෙන් එවීමට හෝ ගෙනැවිත් භාර දීමට හෝ පුළුවන.

3. කාර්යාල වේලාවන් පෙරවරු 8 සිට පස්වරු 4.15 දක්වා වේ.

4. මුදල් ගණුදෙනු කරනු ලබන්නේ පෙරවරු 8.30 සිට පස්වරු 2.45 දක්වා බව සැළකිය යුතුයි.

5. සියළුම දැන්වීම් සහ ප්‍රකාශන සඳහා ගාස්තුව කලින් ගෙවිය යුතුයි. තැපැලෙන් දැන්වීම් සහ ප්‍රකාශනයන් එවන විට, ඒ සමගම අයවිය යුතු ගාස්තුව සඳහා මනි ඕඩරයක්, පෝස්ටල් ඕඩරයක් හෝ චෙක් පතක් රජයේ මුද්‍රණාලයාධිපති නමට එවිය යුතුයි.

6. ප්‍රමාදය සහ දෙස් වළක්වා ගැනීම සඳහා, පළකරන්නට නියමිත " පිටපත " කඩදාසියේ එක් පැත්තක පැහැදිලිව ලියා එවිය යුතුයි. ටයිප් ගසා එවනවා නම් වඩාත් හොඳයි.

7. සෑම අත්සනකටම යටින් අකුරු වෙන්කොට පැහැදිලිව අත්සනේ අකුරු ලිවිය යුතුයි.

8. වෙළඳ ප්‍රචාරක කටයුතු සඳහා දැන්වීම් හා රජයේ සේවයේ නොවන අයගේ නම් වෙනස් කිරීම් පිළිබඳ කරන දැන්වීම් හෝ පළ කරනු නොලැබේ.

9. උසාවියේ අණපනත් යටතේ නිකුත් කළායයි හැඟෙන ප්‍රකාශන, සුප්‍රීම් උසාවියේ පෙරකදෝරු මහතකුගේ අනුමැතිය හෝ අත්සන නොමැතිව ප්‍රසිද්ධ කරනු නොලැබේ.

10. 1968 දෙසැම්බර් මස 1 වෙනි දින සිට දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අයකරන ගාස්තු මෙසේයි :—

| | රු. | ශ. |
|---|---|---|
| අඟලකට හෝ ඉන් අඩුව ... ... ... | 20 | 0 |
| වැඩි වන සෑම අඟලකට හෝ ඉන් කොටසකට ... ... | 20 | 0 |
| තනි තීරුවකට හෝ ගැසට් පිටුවකින් අඩකට ... ... | 220 | 0 |
| තීරු දෙකකට හෝ සම්පූර්ණ ගැසට් පිටුවකට ... ... | 440 | 0 |

අඟලේ සෑම කොටසකටම සම්පූර්ණ අඟලකට අය කරනු ලබන ගාස්තුව අය කරනු ලැබේ.

11. සෑම සිකුරාද දිනයකම ශ්‍රී ලංකා ජනරජයේ " ගැසට් " පත්‍රය පළ කරනු ලැබේ. ප්‍රසිද්ධ නිවාඩු දින අතරට පැමිණෙන සෑම සතියකදී ම පළ කරන දිනය වෙනස් වීමට ඉඩ තිබේ.

12. 1966 මාර්තු 1 වෙනිදා සිට ගැසට් පත්‍රයේ සෑම කොටසකම කෙළවරෙහි වෙනම පළවන දැන්වීමේ සඳහන් ප්‍රකාර සියළුම දැන්වීම් සහ ප්‍රකාශනයන් කොළඹ, රජයේ මුද්‍රණාලයේ, මුද්‍රණාලයාධිපති තැනට ලැබෙන සේ එවිය යුතුය.

13. 1968.12.01 දින සිට සංශෝධිත දායක ගාස්තු* —

**ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය—වාර්ෂික**

| | මෙරට රු. | ශ. | පිටරට රු. | ශ. |
|---|---|---|---|---|
| එක් කොටසක් ... ... ... | 46 | 0 | 60 | 0 |
| I වැනි කොටසේ එක ඡේදයක් ... ... | 36 | 0 | 42 | 0 |
| I වැනි කොටසේ ඡේද දෙකක් ... ... | 43 | 50 | 51 | 50 |

වර්ෂය අවසානයේ හෝ අර්ධ වර්ෂයක අවසානයේ නිමවන සේ දායක ගාස්තු භාර ගනුයේ 6 මාසයකට නො අඩු කාලයකට පමණය.

***තනි පිටපත් සඳහා ගාස්තු—(පිටපත් විකිණීමට තිබේ නම්)**

| | මිළ රු. | ශ. | තැපැල් ගාස්තු මෙරට රු. | ශ. |
|---|---|---|---|---|
| (අ) (i) ගැසට් පත්‍රයේ සඳහන් දිනයෙන් මසක් ඇතුළතදී එක කොටසක් ... ... | 0 | 50 | 0 | 20 |
| (ii) ගැසට් පත්‍රයේ සඳහන් දිනයෙන් මසකට පසු, එක කොටසක් ... ... | 1 | 0 | 0 | 20 |
| (ආ) (i) ගැසට් පත්‍රයේ සඳහන් දිනයෙන් මසක් ඇතුළත දී, I වැනි කොටසේ එක ඡේදයක් ... ... | 0 | 30 | 0 | 15 |
| (ii) ගැසට් පත්‍රයේ සඳහන් දිනයෙන් මසකට පසු I වැනි කොටසේ එක ඡේදයක් ... ... | 0 | 60 | 0 | 15 |

දායක මුදල් බාර ගැනීම සහ තනි පිටපත් විකිණීම බාර, කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත මුදල් ලැබෙන්නට සලස්වන්න.

## ගැසට් පත්‍රය පළකිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය සාමාන්‍යයෙන් සිකුරාද දිනවල පළ කරනු ලැබේ. සිකුරාද දිනයක් ආණ්ඩුවේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාද දිනයට ප්‍රථම වැඩ කරන දිනයේ ගැසට් පත්‍රය පළ කරනු ලැබේ. ඒ අනුව ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා නිවේදන භාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන ප්‍රසිද්ධ නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දින සහ වේලාවන් පහත පළ කර ඇති උපලේඛනයේ දැක්වේ. පහත සඳහන් නියමිත වේලාවන්ට පසුව ලැබෙන සියළුම දැන්වීම් එය එවූ අය වෙත තැපැලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ ගැසට් පත්‍රයේ එය පළ කළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් උවමනා ගැසට් පත්‍රයට දැන්වීම ඇතුලත් වනවාත් හැර එය සියළුදෙනාගේ පහසුවටද හේතු වන බව සළකන්න.

ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති දායක මුදල් භාර නොගනී. සියළුම දායක මුදල් කොළඹ, මහලේකම් කාර්යාල ගොඩනැගිල්ලේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත කෙලින්ම ගෙවිය යුතුයි.

සැ.යු.—මුදල් ගෙවා ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන දැන්වීම් සඳහා අයවිය යුතු මුදල් රජයේ ප්‍රකාශනාංශයේ අධිකාරී වෙත නොව ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති වෙත එවිය යුතු බව සළකන්න.

### උපලේඛනය

1975

| මාසය | පළකිරීමේ දිනය | | ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දිනය හා වේලාව | | |
|---|---|---|---|---|---|
| මාර්තු ... | 07.03.75 | සිකුරාද ... | 26.02.75 | බදාද | දවල් 12.00 |
| | 14.03.75 | සිකුරාද ... | 05.03.75 | බදාද | දවල් 12.00 |
| | 21.03.75 | සිකුරාද ... | 12.03.75 | බදාද | දවල් 12.00 |
| | 27.03.75 | බ්‍රහස්පතින්ද ... | 19.03.75 | බදාද | දවල් 12.00 |
| අප්‍රේල් ... | 04.04.75 | සිකුරාද ... | 25.03.75 | අඟහරුවාද | දවල් 12.00 |
| | 11.04.75 | සිකුරාද ... | 02.04.75 | බදාද | දවල් 12.00 |
| | 18.04.75 | සිකුරාද ... | 09.04.75 | බදාද | දවල් 12.00 |
| | 24.04.75 | බ්‍රහස්පතින්ද ... | 16.04.75 | බදාද | දවල් 12.00 |
| මැයි ... | 02.05.75 | සිකුරාද ... | 23.04.75 | බදාද | දවල් 12.00 |
| | 09.05.75 | සිකුරාද ... | 30.04.75 | බදාද | දවල් 12.00 |
| | 16.05.75 | සිකුරාද ... | 07.05.75 | බදාද | දවල් 12.00 |
| | 23.05.75 | සිකුරාද ... | 14.05.75 | බදාද | දවල් 12.00 |
| | 30.05.75 | සිකුරාද ... | 21.05.75 | බදාද | දවල් 12.00 |
| ජූනි ... | 06.06.75 | සිකුරාද ... | 28.05.75 | බදාද | දවල් 12.00 |
| | 13.06.75 | සිකුරාද ... | 04.06.75 | බදාද | දවල් 12.00 |
| | 20.06.75 | සිකුරාද ... | 11.06.75 | බදාද | දවල් 12.00 |
| | 27.06.75 | සිකුරාද ... | 18.06.75 | බදාද | දවල් 12.00 |

එල්. ඩබ්ලිව්. පී. පීරිස්,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

1975 ජනවාරි මස 01 වැනි දින,
ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව, කොළඹ.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී